වාර්ෂික වාර්තාව 2022

ஆண்டறிக்கை 2022

ANNUAL REPORT 2022



LAKE HOUSE

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

தி அஸோஸியேட்டட் நியூஸ் பேப்பர்ஸ் ஒப் சீலோன் லிமிட்டட்

The Associated Newspapers of Ceylon Limited

වාර්ෂික වාර්තාව
2022

LAKE HOUSE

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

පටුන

දැක්ම, මෙහෙවර හා ඇගයුම්	03
සමූහයේ විශේෂිත වූ මූල්‍ය දත්තයන්	04
සභාපතිතුමාගේ සමාලෝචනය	06
මානව සම්පත්	08
මූල්‍ය සමාලෝචනය	09
අවදානම් තත්ත්ව කළමනාකරණය	10
ආයතනික පාලනය	13
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	16
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම	19
විගණකාධිපතිතුමාගේ වාර්තාව	20
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	32
විස්තරාත්මක ආදායම් ප්‍රකාශය	33
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය	34
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	35
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	36
විගණන නිරීක්ෂණ පිළිබඳ සභාපතිගේ අදහස්	60
එකතුකළ වටිනාකම් ප්‍රකාශය	64
දස අවුරුදු සාරාංශය	65
කොටස් හිමියන් පිළිබඳ තොරතුරු	66
ආයතනික තොරතුරු	67

දැක්ම

ශ්‍රී ලංකාවේ වැඩිම ව්‍යාප්තියක් සහිත ජනප්‍රියම මාධ්‍ය සේවා සැපයුම්කරු

මෙහෙවර

සියලු පාර්ශවකරුවන්ගේ අභිලාෂයන් සපුරාලමින් මනා ප්‍රමිතියක් සහ ලාභදායකත්වයක් සහිතව තිරසරව මාධ්‍ය සේවා සැපයීම.

අරමුණු

- පුවත්පත් කර්මාන්තයේ වෙළඳපල ප්‍රමුඛයා වීමට.
- නිවැරදි සහ සත්‍ය තොරතුරු සැපයීමට.
- වඩාත් කාර්යක්ෂම පුවත්පත් සේවා සපයන්නා සහ වාහකයා වීමට.
- පාරිභෝගික සේවයේ විශිෂ්ටත්වය.
- නවතම ප්‍රවණතා සහ ඉල්ලීම් සහ වෙළඳ නාම ස්ථානගත කිරීම මත පදනම්ව වෙළඳපල වෙන් කරවා ගැනීමට.
- මුද්‍රිත මාධ්‍ය වෙළඳ ප්‍රචාරණ කලාත්මකභාවයේ වෙළඳපල නායකත්වය ශක්තිමත් කිරීමට.
- නව මාධ්‍යවල වඩාත් සක්‍රීය ප්‍රකාශකයා බවට පත්වීම.
- අභිසාරී සමාජ මාධ්‍ය වෙත ප්‍රවේශය ලබා ගැනීමට.
- පුවත්පත් වෙබ් මුද්‍රණයේ විශිෂ්ටත්වය දැක්වීමට.
- මානව සම්පත් ප්‍රතිපත්ති සහ භාවිතයන් වැඩි දියුණු කිරීමට.

සමූහයේ විශේෂිත වූ මූල්‍ය දත්ත

ආදායම
රුපියල් මිලියන

1,854

ශුද්ධ ලාභය (අලාභය)
රුපියල් මිලියන

(197)

මුළු වත්කම්
රුපියල් මිලියන

3,341

කොටස් හිමියන්ගේ මුළු හිමිකම
රුපියල් මිලියන

1,770

සමූහයේ විශ්ලේෂිත වූ මූල්‍ය දත්ත

මූල්‍ය ක්‍රියාකාරිත්වය	ඒකකය	2022	2021	වෙනස %
පිරිවැටුම	රු. 000	1,854,347	2,217,890	-16%
දළ ලාභය	රු. 000	1,009,497	1,289,541	-22%
බදු හා සාධාරණ අගය ගැලපීමට පෙර ලාභය / (අලාභය)	රු. 000	(191,936)	332,002	-158%
බදු හා සාධාරණ අගය ගැලපීමෙන් පසු ලාභය/(අලාභය)	රු. 000	(197,357)	345,454	-157%
දළ ලාභ අනුපාතය	%	54%	58%	-7%
ශුද්ධ ලාභ අනුපාතය	%	-11%	16%	-169%
වත්කම් මත ප්‍රතිලාභ	%	-6%	10%	-160%
කොටස් මත ප්‍රතිලාභ	%	-11%	19%	-158%

මූල්‍ය තත්ත්වය

වත්කම්	රු. 000	3,341,457	3,440,633	-3%
ප්‍රාග්ධන පිරිවැය	රු. 000	20,270	31,624	-36%
පොළී ගෙවීම් මත වගකීම්	රු. 000	352,184	494,261	-29%
අනෙකුත් වගකීම්	රු. 000	1,219,246	1,099,963	11%
කොටස් හිමියන්ගේ හිමිකම	රු. 000	1,770,027	1,846,410	-4%
ණය / කොටස්	වාර ගණන	0.89	0.86	3%
කොටසක ශුද්ධ වත්කම්	රු.	508	530	-4%
ජංගම අනුපාතය	වාර ගණන	3.4	3.1	10%
ක්ෂණික අනුපාතය	වාර ගණන	2.6	2.1	24%

සභාපතිතුමාගේ සමාලෝචනය



සභාපතිතුමාගේ සමාලෝචනය

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

මූල්‍ය ක්‍රියාකාරිත්වය

2022 වර්ෂයේ මුල් කාර්තු දෙක තුළ රට තුළ පැවති අයහපත් සමාජයීය, ආර්ථික සහ දේශපාලන වාතාවරණය තුළ නිවැරදි උපායමාර්ගික සැලසුම් හා කළමනාකරණ තීරණ හේතු කොට ගෙන 2022 වසරේ මුල් මාස හතෙහි පැවති ශුද්ධ අලාභය වූ රුපියල් මිලියන 269 ක වටිනාකම වර්ෂය අග වන විට රුපියල් මිලියන 197 ක සීමාවකට අඩු කර ගැනීමට හැකි විය.

අනාගත දැක්ම

සමාලෝචිත වර්ෂය තුළදී, රට තුළ පැවති අයහපත් සමාජයීය, ආර්ථික සහ දේශපාලන වාතාවරණය තුළ වුවද සමාගම සුවිශේෂී ලෙස තම කාර්යභාරය සිදු කරන ලදී. ලෝක වෙළෙඳපොල තුළ මුද්‍රණ කඩදාසි මිල ඉහළ යාම, රුපියල අවප්‍රමාණය වීම සහ අධි උද්ධමනය සමාගමේ මෙන්ම පුවත්පත් කර්මාන්තයේද අනාගතය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. ඉදිරියේදී සමාගම විසින් ආදායම් වැඩි දියුණු කිරීමේ නව ක්‍රම හඳුන්වා දීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ලබා ගෙන ඇති අතර පිරිවැය කළමනාකරණය කිරීම සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ උපාය මාර්ග සහ ඩිජිටල්කරණයේ උපරිම ඵල නෙළා ගනිමින් තිරසාර සහ ලාභදායී වර්ධනයක් ළඟා කර ගනිමින් රටේ ආර්ථික උන්නතිය සඳහා ශක්තියක් වීම අපගේ බලාපොරොත්තුවයි.

ඇගයීම

ලේක් හවුස් ආයතනය මත තබන ලද විශ්වාසවන්තභාවය වෙනුවෙන් අපගේ වටිනා ගනුදෙනුකරුවන්, කොටස් හිමියන්, කාර්ය මණ්ඩල හා අනෙකුත් සියලුම සම්බන්ධිත පාර්ශවකරුවන් වෙත මාගේ අවංක ස්තූතිය පුද කරන අතර අනාගතයේදී ද ඔවුන්ගේ සහය අපේක්ෂා කරමි. අපගේ අනාගත බලාපොරොත්තුව වන්නේ අප ආයතනය ලාභ ලබන, ජනතාව වෙත නිවැරදි තොරතුරු ලබා දෙන ප්‍රමුඛතම මුද්‍රිත මාධ්‍ය ආයතනය ලෙස නව තාක්ෂණය සමග ඉදිරියට යාමයි.


මහාචාර්ය හරේන්ද්‍ර කාරියවසම්
සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ
2023 දෙසැම්බර් 22

මානව සම්පත්


ආයතනයේ ශ්‍රම බලකාය අප ආයතනයේ වැදගත්ම අංශය වශයෙන් පිළිගෙන ඇති අතර, සමාගම විසින් සමාගමේ උන්නතිය වෙනුවෙන් උරදෙන සේවකයන් හඳුනාගැනීමට මානව සම්පත නිරන්තර ඇගයීමකට ලක් කරනු ලබයි. ආයතනික උපක්‍රමශීලී අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදහස ඇතිව මානව සම්පත් ඒ උදෙසා පෙළගස්වමින් සේවක ආරක්ෂණය රඳවා ගැනීම සහ හැකියාවන් වර්ධනය කර ගැනීම වෙනුවෙන් සේවක සුභසාධක පහසුකම්ද වැඩිදියුණු කරන ලදී.

ස්ත්‍රී පුරුෂ භේදය (දෙසැම්බර් 31 දිනට)

ස්ත්‍රී පුරුෂ භාවය	2022		2021	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
පුරුෂ	853	76%	1,003	77%
ස්ත්‍රී	266	24%	295	23%
එකතුව	**1,119**	**100%**	**1,298**	**100%**



සේවා කාල විශ්ලේෂණය




සේවකයන්ගේ සාමාන්‍ය සේවා කාලය

සේවා කාලය	2022		2021	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
අවුරුදු 25 ට වැඩි	197	18%	180	14%
20 - 25	216	19%	196	15%
5 - 20	455	41%	507	39%
අවුරුදු 5 ට අඩු	251	22%	415	32%
එකතුව	**1,119**	**100%**	**1,298**	**100%**

වයස් විශ්ලේෂණය

වයස	2022		2021	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
අවුරුදු 50 ට වැඩි	332	30%	380	29%
40-50	508	45%	536	41%
30-40	220	20%	279	22%
20-30	59	5%	103	8%
එකතුව	**1,119**	**100%**	**1,298**	**100%**



මූල්‍ය වාර්තාකරණය හා කාර්ය සිද්ධි

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම මූල්‍ය වාර්තාකරණය හා යාවත්කාලීන කිරීම සඳහා නවීනතම මූල්‍ය වාර්තා කිරීම් තෝරා ගන්නා ලදී. 32 සිට 59 වන පිටු දක්වා මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම වරලත් ගණකාධිකාරී ආයතනයේ රෙගුලාසිවලට අනුකූලව සකස් කොට ඇත. එසේම සෑම අවස්ථාවකදීම ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන්නන්ට පැහැදිලි හා පුළුල් දැනුමක් ඇතිවන පරිදි මූල්‍ය වාර්තා සකස් කොට ඇත.

මූල්‍ය ක්‍රියාකාරීත්වය

සමූහයේ මූල්‍ය ක්‍රියාකාරීත්ව සාරාංශ

	2022 රු. මිලියන	2021 රු. මිලියන	වෙනස රු. මිලියන
ආදායම	1,854	2,218	(364)
විකුණුම් පිරිවැය	845	928	(83)
දළ ආදායම	**1,009**	**1,290**	**(281)**
වෙනත් ආදායම්	276	499	(223)
පරිපාලන වියදම්	1,026	1,001	25
බෙදාහැරීමේ වියදම්	376	310	66
මූල්‍ය වියදම්	76	54	22
ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමට පෙර ලාභය	**(192)**	**424**	**(616)**
ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ වියදම	-	92	(92)
බදු සහ සාධාරණ අගය ගැලපීමට පෙර ලාභය	**(192)**	**332**	**(524)**
බදු වියදම	-	4	(4)
සාධාරණ අගය ගැලපීම	(5)	9	(14)
බදු සහ සාධාරණ අගය ගැලපු පසු ලාභය	**(197)**	**345**	**(542)**

ආදායම් මූලාශ්‍ර	2022 රු. මිලියන	2021 රු. මිලියන
දැන්වීම්	1,490	1,857
පුවත්පත් අලෙවි ආදායම	331	319
වෙළඳ මුද්‍රණ ආදායම	33	42
වෙනත් ආදායම්	276	499
මුළු ආදායම	**2,130**	**2,717**

අවදානම් තත්ත්ව කළමනාකරණය

ලේක්හවුස් ආයතනය තම අරමුණු සහ අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා ආයතනයේ අවදානම් තත්ත්ව කළමනාකරණ ක්‍රියාවලිය සඳහා නිසි සැලකීමක් දක්වා ඇත. පූර්ණ වශයෙන් ඉවත් කිරීමට නොහැකි අවදානම් තත්ත්වයන් හැකි පමණින් අවම කර ගැනීම සඳහා අවදානම් තත්ත්ව කළමනාකරණය යටතේ පවතින මූල්‍ය සහ ව්‍යාපාර යන අවදානම් අවස්ථාවන් ආයතනය මගින් ක්‍රමානුකූලව විමර්ශනය කරනු ලැබේ.

අවදානම් අනාවරණය	ආයතනික අරමුණු	ආයතනික වැඩසටහන්
මූල්‍ය අවදානම් කළමනාකරණය		
01. **මූල්‍ය හා ද්‍රවශීලතා කළමනාකරණය**	• ද්‍රවශීලතා තත්ත්වය පවත්වාගැනීම.	• වෙළඳ ණයගැතියන්, නිෂ්පාදන සැලසුම්කරණය සහ කෙටි කාලීන ණය පහසුකම් යනාදිය විධිමත්ව හැසිරවීම මගින් මෙය ඉටුකර ගනු ලැබේ. • අනාගත අරමුදල් අවශ්‍යතා වෙනුවෙන් අතිරේක ඇප වශයෙන් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් වත්කම් ආයතනය සතුව පවතී. • ප්‍රමාණවත් ලෙස ද්‍රවශීලතා තත්ත්වය පවත්වා ගැනීම සඳහා මූල්‍ය ආයතන කිහිපයක් මගින් අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාගැනීම.
02. **පොලී අනුපාතික අවදානම**	• පොලී අනුපාත උච්චාවචනය වීමෙන් ඇති වන අහිතකර බලපෑම් අවම කිරීම.	• ව්‍යාපාර සමූහයෙහි ණය ගැනීම් සහ ආයෝජන සඳහා ප්‍රශස්ත පොලී අනුපාතයක් ලබා ගැනීම සඳහා බැංකුකරුවන් සමග සාකච්ඡා කිරීම. • දේශීය පොලී අනුපාතයන්හි ඇතිවන අහිතකර උච්චාවචනයන් වැළැක්වීම සඳහා සහ අධික පිරිවැය අවම කිරීම සඳහා සැපයුම්කරුවන්ගෙන් ණය පහසුකම් ලබාගැනීම සහ සාකච්ඡා කිරීම.
ව්‍යාපාර අවදානම් කළමනාකරණය		
01. **ණය අවදානම**	• ණයගැතියන් අදාළ ණය පැහැර හැරීමෙන් ඇති වන අවදානම අවම කිරීම.	• දැන්වීම් නියෝජිතවරුන් සඳහා පහසුකම් සලසා දීම. • ගනුදෙනුකරුවන්ගේ ණය යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා තක්සේරු ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීම. • අඩමාණ ණය සඳහා වෙන් කිරීම සහ ප්‍රමාණවත් ලෙස විමර්ශනය කිරීම සඳහා ආයතනය මගින් පුළුල් වූ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යනු ලබයි.
02. **වත්කම් අවදානම**	• ගින්නෙන් සහ සොරසතුරු උවදුරු මගින් ඇතිවන හානි සහ යන්ත්‍රසූත්‍ර ක්‍රියා විරහිත වීම මගින් ඇතිවන හානි අවම කිරීම.	• යන්ත්‍ර සූත්‍ර සඳහා පූර්ණ රක්ෂණ ආවරණයන් ලබා ගැනීම. • ආපදා වැළැක්වීමට අදාළ නඩත්තු කිරීමේ වැඩ පිළිවෙලවල් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

අවදානම් තත්ත්ව කළමනාකරණය

අවදානම් අනාවරණය	ආයතනික අරමුණු	ආයතනික වැඩසටහන්
03. අභ්‍යන්තර පාලන ක්‍රම	• ආයතනයේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා වඩාත් යෝග්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම පද්ධතියක් පවත්වා ගැනීම.	• අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් නිරතුරුවම අභ්‍යන්තර විගණන වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම.
04. මානව සම්පත්	• සේවයෙන් හැර යාම අවම කිරීම. • බාධාවලින් තොරව වඩාත් සුමට ලෙස මෙහෙයුම් කටයුතු ගලායාම තහවුරු කිරීම. • පුහුණුව හා වඩාත් සුදුසු ක්‍රමවේද මගින් අනුගතවීම තහවුරු කිරීම.	• සේවකයන් ඇගයීමේ යෝජනා ක්‍රමයක් පවත්වා ගැනීම මගින් ඔවුන් හට දිරි දීමනා ලබා දීම. • ඒකාබද්ධ උපදේශන කමිටු මගින් සියලුම තලයන්හි සේවකයන් සමග වඩාත් හොඳ සහ සුහද සම්බන්ධතා පවත්වා ගැනීම. • විවිධ වූ සේවක ප්‍රතිලාභ ලබා දීම. • අවශ්‍ය අවස්ථාවන්හිදී නිශ්චිත සහ සාමාන්‍ය පුහුණුවීම් ලබා දීම.
05. තාක්ෂණික සහ ගුණාත්මක භාවය පිළිබඳ අවදානම	• යල්පැනීම අවම කිරීම සඳහා පවත්නා තාක්ෂණික වැඩි දියුණුවීම් සහ ගුණත්ව ප්‍රමිතීන් සමග අනුගත වීම.	• පවත්නා යන්ත්‍ර සූත්‍ර වෙනුවට තාක්ෂණික වශයෙන් වැඩිදියුණු වූ යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම සඳහා දිගුකාලීන සැලැස්මක් සැකසීම.
06. තොග කළමනාකරණය පිළිබඳ අවදානම	• අවශ්‍ය තරම් තොග නොපැවැත්වීමේ අවදානම අවම කිරීම. • ඉතා සෙමින් ඉවත් වීමේ තොග එක්රැස් වීම අවම කිරීම. • යල්පිරුනු තොග මගින් ඇති වන අලාභය අවම කිරීම. • නියමිත ප්‍රමිතියෙන් තොර අමුද්‍රව්‍ය තොග ලැබීමේ අවදානම අවම කිරීම. • තොග පවත්වා ගැනීමේ දින ගණන අවම කිරීම.	• මාසිකව පවත්වනු ලබන නිෂ්පාදන සැලසුම් කිරීමේ රැස්වීම් මගින් අයවැය සහ විකුණුම් පුරෝකථන යොදා ගනිමින් මාසික නිෂ්පාදනය සැලසුම් කිරීම. • ඉවත් නොවීමේ තොග හඳුනා ගැනීම සඳහා අඛණ්ඩ තොග තහවුරු කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. • තොග පවත්වා ගැනීමේ දින ගණන නිරන්තරයෙන්ම අධීක්ෂණය කිරීම. • ඉතා සෙමින් ඉවත්වීමේ තොග සඳහා අවශ්‍ය පරිදි වෙන් කිරීම සහ කලින් කලට සමාලෝචනය කිරීම.
07. තරඟකාරීත්වයේ අවදානම	• තරඟකරුවන් වෙත අපගේ වෙළඳපල කොටස හිමිවීමේ අවදානම අවම කිරීම.	• විවිධ දැන්වීම් සහ ප්‍රවර්ධන ව්‍යාපාර මගින් ලේක්හවුස් සන්නම් නාමය ශක්තිමත් කිරීම. • දිවයින පුරා අප නිෂ්පාදන ව්‍යාප්ත කිරීම තවදුරටත් පවත්වා ගැනීම.
08. ප්‍රාග්ධන ආයෝජන	• පවත්නා සහ අනාගත ආයෝජන මගින් අලාභ ඇතිවීමේ අවදානම අවම කිරීම.	• වත්කම්වල සිදු කරනු ලබන ආයෝජන නියමිත ලෙස සැලසුම් කොට තිබීම සහ එම ආයෝජන නියමිත කලට සිදු කිරීම. • හැකි උපරිම අයුරින් වත්කම්වල ඌණ උපයෝජනය අවම කිරීම

අවදානම් තත්ත්ව කළමනාකරණය

අවදානම් අනාවරණය	ආයතනික අරමුණු	ආයතනික වැඩසටහන්
09. **තොරතුරු පද්ධති**	• දත්ත ආරක්ෂාව, දෘඩාංග, මෘදුකාංග සහ සන්නිවේදන පද්ධති මගින් ඇති විය හැකි අවදානම අවම කිරීම.	• නිතිපතා දත්ත සුරැකුම් කිරීම සහ බාහිර ස්ථානවල එම දත්ත ගබඩා කිරීම. • උපකාරක සේවාවන් සහ නඩත්තු කටයුතු සඳහා සැපයුම්කරුවන් සමග ගිවිසුම්වලට එළඹීම. • වෛරස් සෙවුම්, ෆයර්වෝල් පද්ධති (Firewall) සහ මෘදුකාංග නිරතුරුවම යාවත්කාලීන කිරීම.
10. **පාරිසරික ගැටලු**	• මෙහෙයුම් කටයුතු මගින් පරිසරයට ඇතිවන සෘණාත්මක බලපෑම අවම කිරීම.	• අදාළ අධිකාරීන් මගින් පනවනු ලබන ප්‍රමිතීන්ට අනුකූල වීම සහ එම අනුකූලතාවය තහවුරු කිරීම.
11. **නෛතික සහ නියාමන ගැටලු**	• ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල නොවීම මගින් ඇතිවන අලාභ අවම කිරීම. • නියාමන අවශ්‍යතා විටින් විට වෙනස්වීම මගින් ඇති විය හැකි බලපෑම අවම කිරීම හෝ ඒ සඳහා අදාළ පියවර ගැනීම.	• අදාළ අධිකාරීන් මගින් පනවනු ලබන ප්‍රමිතීන්ට අනුකූලවීම සහ එම අනුකූලතාවය තහවුරු කිරීම. • ව්‍යවස්ථාපිත සහ නියාමන ආයතන මගින් පනවනු ලබන අවශ්‍යතාවයන් හා අනුගත වීම. • අවශ්‍ය වූ අවස්ථාවලදී ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය මගින් උපදෙස් ලබාගැනීම.
12. **කෝවිඩ් 19 වසංගත අවදානම**	• කොවිඩ් රහිත වැඩ පරිසරයක් නිර්මාණය කිරීම	• සේවක එන්නත්කරණය • අවම කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදවීම • ආයතනය විෂබීජහරණය කිරීම • මුහුණු ආවරණ බෙදා දීම • හුදකලා කිරීමේ පහසුකම් සැලසීම • සේවක ප්‍රවාහන පහසුකම් සැලසීම • රජය විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූල වීම

ආයතනික පාලනය

ලංකාවේ ඇල්මති පාර්ශවයන්ගේ අගය නිර්මාණයෙහි සහ දිගුකාලීන තිරසාර පැවැත්මෙහි පදනම ශක්තිමත් ආයතනික පාලනයයි. ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, එහි පෘථුල ප්‍රතිපත්ති රාමු තුල ප්‍රත්‍යක්ෂ කොට ඇති පරිදි සහයෝගය බල තුලනයකට පහසුකම් සලසන පරිදි පැහැදිලි පාලන ව්‍යූහයක් තුල ව්‍යාපාරික සාරධර්ම, වගවීම් සහ විනිවිද බව සහ උසස් ප්‍රමිතීන් කෙරෙහි කැපවී සිටියි.

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම ව්‍යාපාරික ආචාර ධර්ම, වගවීම සහ විනිවිද භාවය පිලිබඳව ඉහළම ප්‍රමිතීන්ට කැපවී සිටින අතර සමාගමේ ආයතනික පාලනය සැලසුම් කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවශ්‍යතාවයන්ට අනුකූලවයි.

1. අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය, තම වගකීම් ඵලදායී ලෙස ඉටුකිරීමට ශක්තිය ලබාදෙන නිපුණතා, පලපුරුද්ද, ස්වාධීනත්වය සහ දැනුම අදාළ සමබරතාවයෙන් හෙබි අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විතය. නිරන්තරයෙන් රැස්වෙන අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමට වැදගත් වන කරුණු පිළිබඳ තීරණ ගැනීමේ ප්‍රධාන මණ්ඩලය වේ.

01.01.2022 සිට 31.05.2022 දක්වා

අධ්‍යක්ෂවරයාගේ නම	පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව	සහභාගිවූ රැස්වීම් සංඛ්‍යාව
ජනාධිපති නීතිඥ ඩබ්. දයාරත්න මහතා - සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ	18	18
කණිෂ්ක ගයා විතාරණ මහතා	18	18
රඛිත අබේගුණවර්ධන මහතා	18	18
ජනක රණතුංග මහතා	18	18
ධර්ම ශ්‍රී කාරියවසම් මහතා	18	18

03.06.2022 සිට 31.12.2022 දක්වා

අධ්‍යක්ෂවරයාගේ නම	පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව	සහභාගිවූ රැස්වීම් සංඛ්‍යාව
අනුෂ පැල්පිට මහතා	30	30
සිසිර කුමාර පරණතන්ත්‍රී මහතා	30	30
ප්‍රභාත් මංජුල මාකුඹුර මහතා	30	24

13.06.2022 සිට 31.12.2022 දක්වා

අධ්‍යක්ෂවරයාගේ නම	පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව	සහභාගිවූ රැස්වීම් සංඛ්‍යාව
ජනක රණතුංග මහතා	29	26
මහාචාර්ය හරේන්ද්‍ර කාරියවසම් මහතා	29	28

ආයතනික පාලනය

2. අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හා ඒවායේ සංයෝගය

මණ්ඩලය, පහත සඳහන් කමිටු පිහිටුවා ඇත.

2.1 විධායක කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩලයට කාර්යක්ෂමව සිය වගකීම් ඉටු කිරීමට හැකි වනසේ අදාළ හා කාලෝචිත තොරතුරු මණ්ඩලය වෙත ලබාදීම විධායක කමිටුවේ වගකීම වේ. විධායක කමිටුවේ සාමාජිකයින් පහත දැක්වේ.

- අධ්‍යක්ෂ මණ්ඩලය
- සාමාන්‍යාධිකාරී
- අතිරේක සාමාන්‍යාධිකාරී
- සමාගමේ ලේකම්
- ප්‍රධාන කර්තෘවරු
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්

2.2 විගණන කමිටුව

අඛණ්ඩව කාර්තුවකට වතාවක් රැස්වෙන විගණන කමිටුව සමාගම සතුව ස්ථිර මූල්‍ය වීනයක් පවතින බව තහවුරු කිරීමට අභ්‍යන්තර පාලන කටයුතුවල ප්‍රබලත්වය සමාලෝචනය කොට අධීක්ෂණය කරනු ලබයි. විගණන කමිටුව, අභ්‍යන්තර විගණනයෙහි වාර්ෂික විගණන ක්‍රියාකාරී සැලැස්ම කලින්ම අනුමත කොට එහි සම්පාදනය හා ප්‍රගතිය අධීක්ෂණය කරයි. විගණන කමිටු සාමාජිකයින් මෙසේය.

- අධ්‍යක්ෂ - මූල්‍ය
- අධ්‍යක්ෂ - නීති හා පරිපාලන
- සාමාන්‍යාධිකාරී
- සමාගමේ ලේකම්
- අතිරේක සාමාන්‍යාධිකාරී
- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- රජයේ විගණක අධිකාරී
- ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයෙකු

2.3 ප්‍රසම්පාදන කමිටුව

ප්‍රසම්පාදන කමිටුව (රුපියල් මිලියනයකට වඩා වැඩි) ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුරූපීව හා නිවැරදිව යොදා ගන්නා බව සහතික කරලීමට ස්ථාපනය කොට ඇත. ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් මෙසේය.

- සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ
- අධ්‍යක්ෂ - මූල්‍ය
- අධ්‍යක්ෂ - නීති හා පරිපාලන
- සාමාන්‍යාධිකාරී
- අතිරේක සාමාන්‍යාධිකාරී
- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- ප්‍රධානී - ප්‍රසම්පාදන

2.4 දුක් ගැනවිලි කමිටුව

සේවක මහත්ම මහත්මීන්ගේ දුක් ගැනවිලි සඳහා පිළියම් සලකා බැලීමට දුක්ගැනවිලි කමිටුව ස්ථාපනය කොට ඇත. මෙම වසර තුළ දුක් ගැනවිලි විමර්ශනයට ලක් කොට නොමැත.

3. මූල්‍ය වාර්තාකරණය සහ විනිවිදභාවය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති, සංකල්ප සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් පනවා ඇති ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව සකස් කොට ඇත. මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කොට ඇත. ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම මූල්‍ය වාර්තාකරණයෙහිලා හොඳම ක්‍රියා මාර්ග යොදා ගනිමින්, මූල්‍ය වාර්තාකරණ පරිසරයෙහි නව ප්‍රවණතා පිළිබඳව යාවත්කාලීනව සිටී. අංක 32 - 59 පිටුවල සඳහන් මූල්‍ය ප්‍රකාශන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් (SME) සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කොට ඇත.

4. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙහිලා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙහිලා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ නිවේදනය මෙම වාර්ෂික වාර්තාවේ 19 වන පිටුවේ සඳහන් කොට ඇත.

5. අභ්‍යන්තර පාලන විධි

අභ්‍යන්තර පාලන පද්ධතිය සැලසුම් කර ඇත්තේ වැරදි, අතපසුවීම්, මඟහැරීම්, වලින් සමාගමේ වත්කම් ආරක්ෂා කිරීම සහ රාජකාරී වැඩ බෙදීම, අධිකාරී මට්ටම් සහ අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටි මඟින් නිසි ගිණුම් පොත් කට්ටලයක් සටහන් කර පවත්වාගෙන යාම සඳහා වන අවදානම ආවරණය කිරීමටය. සමාගමේ ප්‍රමාණවත් හා කාර්ය සාධක අභ්‍යන්තර පාලනයන් ස්ථාන ගතකොට ඇති බව තහවුරු කරලීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. එදිනෙදා මූල්‍යමය හා මූල්‍යමය නොවන ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මඟින් නිතිපතා සමාලෝචනය කෙරේ.

6. ව්‍යවස්ථාපිත ගෙවීම් හා එකඟතාව

හඳුනාගත් සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් මේ දක්වා ගෙවා ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරන අතර, සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සියලු දායක මුදල් ගෙවා ඇත. නැතහොත් මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

7. කොටස්කරුවන් සමඟ සම්බන්ධතාවය

අපි, අපගේ කොටස්කරුවන් හා සමඟ නිතිපතා සම්බන්ධකම් හා සන්නිවේදන කටයුතු පවත්වාගෙන යන්නෙමු.

8. ආයතනික සමාජ වගකීම

ප්‍රජාව හා සමාජය කෙරෙහි තම සවිස්තර වගකීම් සමාගම විසින් මනාව අවබෝධ කර ගෙන සිටී.

9. සේවක කරුණු සහ අදහස් හුවමාරුව

ආයතනයේ සේවකයන්ට පාලනාධිකාරිත්වය වෙත ඔවුන්ගේ දුක් ගැනවිලි ඉදිරිපත් කොට විසඳුම් ලබා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවසර දී ඇත. මේ වර්ෂය තුල කිසිදු කම්කරු ආරවුලක් වාර්තා වී නොමැත.

10. පාරිසරික සුරක්ෂණය

පරිසරයට හානිදායක කිසිදු ක්‍රියාකාරකමකට සමාගම සම්බන්ධ වී නැත.

11. අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂවරු, අවශ්‍ය විමර්ශන සිදු කිරීමෙන් සහ ලබන වසර සඳහා සමාගමේ අයවැය ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා, අනාගත අපේක්ෂාවන්, අවදානම් මුදල් ප්‍රවාහය සහ ණය ලබාගැනීමේ පහසුකම් පිළිබඳ නිරීක්ෂණ ඇතුළු කටයුතු සමාලෝචනය කිරීමෙන් පසු අනාගතය සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වා ගැනීමට සමාගමටත්, සමූහයටත් ප්‍රමාණවත් සම්පත් ඇති බවට සාධාරණ බලාපොරොත්තු තබා ඇත. එම නිසා, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්මේ මූලධර්මය සැලකිල්ලට ගෙන ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා සහිත වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේ ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි.

1. සමාගමේ ක්‍රියාකාරකම්

සමාගමේ ප්‍රමුඛතම ක්‍රියාකාරකම වනුයේ පුවත්පත් මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත්කිරීම හා පුවත්පත් සහ සඟරා බෙදාහැරීමත් ය. මේ සම්බන්ධයෙන් සුවිශේෂී වෙනස්කම් සමාලෝචිත වර්ෂය තුළදී සිදු නොවිණි.

2. මූල්‍ය ප්‍රකාශනයන්

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

3. විගණකවරුන්ගේ වාර්තාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ පිටු අංක 20 දක්වා ඇත.

4. වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

මූල්‍ය වාර්තා සකස් කිරීමේදී වාර්ෂික වාර්තාවේ සඳහන් සුවිශේෂී වූ ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කර ඇත.

5. වාර්ෂික සමාලෝචනය

මූල්‍ය වර්ෂයට අදාළව සමාගමේ ක්‍රියාවලි සමාලෝචනය සහ එහි ප්‍රතිඵලය සභාපතිතුමාගේ සමාලෝචනය හා මූල්‍ය සමාලෝචනය තුළ ඇතුළත් වේ.

6. ආදායම

වර්ෂ 2022 දෙසැම්බර් මස 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා සමාගම ලැබූ ආදායම රුපියල් මිලියන 1,854 කි.

7. ලාභ සහ බෙදාහැරීම් (රුපියල් මිලියන)

	2022	2021
සාධාරණ අගය ගැලපීම්වලට පෙර ලාභය / (අලාභය)	(192)	332
බදු	-	4
සාධාරණ අගය ගැලපීම	(5)	9
සාධාරණ අගය හා බදු අයකිරීමෙන් පසු ලාභ / (අලාභ)	(197)	345
ලාභාංශ	-	-
ඉදිරියට ගෙන ගිය රඳවාගත් ලාභ (අලාභ)	**(197)**	**345**

8. අයභාර සංචිත

2022 දෙසැම්බර් මස 31 දිනට සමාගමේ අයභාර සංචිත රුපියල් මිලියන 330 කි.

9. දේපළ, පිරියත හා උපකරණ

2022 වර්ෂය තුළ සමාගම දේපළ, පිරියත හා උපකරණ යන ප්‍රාග්ධන වියදම් සඳහා සහ නොනිමි ප්‍රාග්ධනය වෙනුවෙන් රු. මිලියන 20 ක් ආයෝජනය කර ඇත. වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණවල වෙනස්වීම් සටහන් අංක 06 යටතේ ඉදිරිපත් කර ඇත.

10. පරිත්‍යාග

සමාගම සමාලෝචිත කාලය තුළ කිසිදු මුදලක් පුණ්‍යායතන සඳහා පරිත්‍යාග කොට නැත.

11. කොටසක ශුද්ධ වත්කම

කොටසක ශුද්ධ වත්කම රුපියල් 508.04 කි.

12. කොටස් පිළිබඳ තොරතුරු

ලාභාංශ හා කොටසක ශුද්ධ වත්කම්වල ඉපයීමට අදාළ තොරතුරු සුවිශේෂී මූල්‍ය දත්තයන් හා දස අවුරුදු සාරාංශයන් යටතේ ඉදිරිපත් කර ඇත. කොටස් බෙදී ගොස් ඇති ආකාරය කොටස් පිළිබඳ තොරතුරු වාර්තාවේ ඇතුළත් වේ.

13. බහුතර කොටස් අයිතිය

ශ්‍රී ලංකා ජනරජය නියෝජනය වන අයුර්න් 87.5% ක කොටස් බහුතරයක් මහා භාරකාරතුමා සතුව පවතී.

14. අධ්‍යක්ෂවරු

2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඔවුන්ගේ කොටස් හිමිකම පහත පරිදි වේ.

අධ්‍යක්ෂකගේ නම	කොටස් ප්‍රමාණය
අනුෂ පැල්පිට මහතා	-
සිසිර කුමාර පරණතන්ත්‍රී මහතා	-
ප්‍රභාත් මංජුල මාකුඹුර මහතා	-
ජනක රණතුංග මහතා	-
මහාචාර්ය හරේන්ද්‍ර කාරියවසම් මහතා	-

15. වර්ෂය තුළ ඉල්ලා අස්වීම් / නව පත්වීම්

2022 වර්ෂයේ ඉල්ලා අස්වූ අධ්‍යක්ෂවරු පහත පරිදි වේ.

අධ්‍යක්ෂකවරයාගේ නම	තනතුර	ඉල්ලා අස්වූ දිනය
ජනාධිපති නීතිඥ ඩබ්. දයාරත්න මහතා	සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ	31.05.2022
රඛිත අබේගුණවර්ධන මහතා	අධ්‍යක්ෂ - නීති හා පරිපාලන	31.05.2022
කණිෂ්ක ගයා විතාරණ මහතා	අධ්‍යක්ෂ - මෙහෙයුම්	31.05.2022
ජනක රණතුංග මහතා	අධ්‍යක්ෂ - මූල්‍ය	31.05.2022
ධර්ම ශ්‍රී කාරියවසම් මහතා	අධ්‍යක්ෂ - කතෘ මණ්ඩල	31.05.2022

2022 වර්ෂයේ අලුතින් පත් කළ අධ්‍යක්ෂවරු පහත පරිදි වේ.

අධ්‍යක්ෂකවරයාගේ නම	තනතුර	පත්වූ දිනය
අනුෂ පැල්පිට මහතා	සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ	03.06.2022
සිසිර කුමාර පරණතන්ත්‍රී මහතා	අධ්‍යක්ෂ - කතෘ මණ්ඩල	03.06.2022
ප්‍රභාත් මංජුල මාකුඹුර මහතා	අධ්‍යක්ෂ - මෙහෙයුම්	03.06.2022
ජනක රණතුංග මහතා	අධ්‍යක්ෂ - නීති හා පරිපාලන	13.06.2022
මහාචාර්ය හරේන්ද්‍ර කාරියවසම් මහතා	අධ්‍යක්ෂ - මූල්‍ය	13.06.2022

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

16. අධ්‍යක්ෂවරුන්ට දුන් ණය

ආයතනය අධ්‍යක්ෂවරුන්ට ණය ලබාදී නොමැත.

17. ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂවරු සෘජුව හෝ වක්‍රව ආයතනයේ ගිවිසුම් සඳහා අත්සන් කොට හෝ ඉදිරි කාලයට අදාළ ගිවිසුම් සඳහා හෝ බැඳී නැත.

18. අධ්‍යක්ෂවරුන්ගේ දීමනා

2022 වර්ෂයේදී අධ්‍යක්ෂවරුන්ගේ දීමනා සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 යටතේ සඳහන් වේ.

19. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

2022 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා ශේෂ පත්‍රය පිළියෙල කිරීමෙන් පසු ගිණුම් මගින් ගැළපුම් කිරීම සඳහා අවශ්‍යතාවයක් පැන නැඟී නොමැත.

20. ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට හා සේවකයින්ට ගෙවන ලද සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවා ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සෑහීමකට පත්වේ.

21. අඛණ්ඩ පැවැත්ම

ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රතිපාදන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. මේ හේතු නිසා මෙම ආයතනය මූල්‍යමය වාර්තා සැකසීමේදී "අඛණ්ඩ පැවැත්ම" පදනම අනුගමනය කරයි.

22. පාරිසරික ආරක්ෂණය

ආයතනය කිසිම අයුරකින් පරිසරය දූෂණය වන සහ පාරිසරික නීති පද්ධතියට අනුකූල නොවන කිසිම කටයුත්තකට සහභාගි නොවූ බවට අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට සෑහීමකට පත්වේ.

23. විගණකවරු

ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 (3) ඡේදය අනුව විගණකාධිපති විසින් වර්ෂයේ ගිණුම් විගණනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
එච්.ඩබ්.එස්. ප්‍රසංගා
සමාගමේ ලේකම්

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ විස්තර පහත දක්වා ඇත. විගණන වාර්තා මගින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ඔවුන්ගේ වගකීම පෙන්වා දී ඇත.

2007 අංක 07 දරන සමාගම් පනත අනුව අධ්‍යක්ෂවරුන් විසින් එක් එක් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු අතර, එම ප්‍රකාශ ගිණුම් වර්ෂය අවසාන දිනට සමාගමේ තත්ත්වය සහ වර්ෂය තුළදී ලද ලාභය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු කළ යුතුය. මෙම ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධ්‍යක්ෂකවරුන් විසින් පහත සඳහන් කරුණු සහතික කළ යුතුය.

1. සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන නොවෙනස්ව අනුගමනය කර ඇති බවත්, යම් ප්‍රමාණාත්මක බැහැර වීමක් ඇතොත් ඒවා හෙලිදරව් කර විස්තර කර ඇති බව,

2. අදාළ ගිණුම් ප්‍රතිපත්ති සියල්ල අනුගමනය කර ඇති බව,

3. තක්සේරු කිරීම් හා ගැළපීම් සාධාරණ සහ තහවුරු කළ හැකි බව,

4. මූල්‍ය වාර්තා සමාගම් පනත සමග අනුකූල වන බව සනාථ කිරීමට සහ සමාගමේ මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් නිරවද්‍යතාවයකින් හෙලිදරව් කිරීමට අවශ්‍ය ගිණුම් වාර්තා ආයතනය පවත්වාගෙන යන බව සහතික කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීමයි. එමෙන්ම සමාගමේ වත්කම් ආරක්ෂා කිරීමට සහ මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් පියවර ගැනීමට අධ්‍යක්ෂවරු වගකිව යුතු අතර, එමගින් වත්කම්වල ආරක්ෂාව සහ වංචා හා වැරදි වැළැක්වීම සහ සොයාගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතික විය හැක.

5. අධ්‍යක්ෂවරු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ වගකිව යුතු අතර, විගණකවරුන්ට විගණන වාර්තාව සකස් කිරීමට අවශ්‍ය සියලුම පහසුකම් ලබාදීම, ඔවුන්ට අවශ්‍ය පරිදි පරීක්ෂා කිරීම් කටයුතු සැලසීම අධ්‍යක්ෂවරුන්ගෙන් සිදුවිය යුතුය.

මෙම වාර්තාවේ සඳහන් පරිදි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම ඔවුන් නොපිරිහෙලා ඉටුකර ඇති බව ඔවුන්ගේ අදහසයි.

ආයතනයේ විගණකවරුන් වන විගණකාධිපති තුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දෙන ලද මූල්‍ය ප්‍රකාශන සමග ගිණුම්කරණ වාර්තා, අදාළ තොරතුරු කොටස් හිමියන්ගේ සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පරීක්ෂා කර බලා ඔවුන්ගේ මතය මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති විගණන වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,
එච්.ඩබ්.එස්. ප්‍රසංගා
සමාගමේ ලේකම්

විගණකාධිපතිතුමාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඒඑම්/සී/ඒඑන්සීඑල්/2/22/එෆ්ඒ-01

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 ජූනි 28 දින

සභාපති
සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සහ එහි පරිපාලිතයන්ගේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ("සමාගම") සහ එහි පරිපාලිතයන්ගේ ("සමූහය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේමාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිතිය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතයේ පරිච්ඡේද අංක 17 හි 17.4 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කමක් ලෙස හඳුනාගත යුතු එකතුව රු.455,715ක් වූ තොරතුරු තාක්ෂණ උපාංග මිලදී ගැනීම නඩත්තු වියදමක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) කුඩා හා මධ්‍ය පරිමාණ අස්පිත්ව සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ පරිච්ඡේද අංක 28 හි 28.34 (ඩී) ඡේදය ප්‍රකාරව ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීමේ යෝජනා ක්‍රමයක ප්‍රතිඵලයක් ලෙස සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කරන විට එකී ප්‍රතිලාභය වගකීමක් හා වියදමක් ලෙස හඳුනාගත යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් දිනට ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ සේවය අවසන් කරන නිලධාරීන් සඳහා ගෙවිය යුතු ප්‍රතිලාභ සම්බන්ධව සමාගම විසින් එම ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අලාභය රු.178,471,698 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අවසන් දින සිට 2023 මාර්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුළ සේවය අවසන් කරන සේවකයන් 149 දෙනෙකුට ගෙවිය යුතු රු.139,692,726 ක් වූ පාරිතෝෂික වටිනාකම ජංගම වගකීම් වශයෙන් වෙනම දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල කල්බදු ණය හිමි වගකීමේ සටහන් කර තිබූ ජංගම හා ජංගම නොවන වගකීම් පිළිවෙලින් රු.2,886,840 ක් හා රු.8,386,829 ක් වුවද, ආයතනය හා විගණනය යන දෙපාර්ශවයේ ගණනය කිරීම්වලට අනුව නිවැරදි වටිනාකම් පිළිවෙලින් රු.3,142,753 ක් හා රු.8,129,817 ක් විය යුතු බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ, පරිසණක මෘදුකාංග බලපත්‍ර 300 කට සහ වෙබ් අඩවිවලට අදාළ නඩත්තු වියදම් රු.820,370 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණි.

(ඉ) 2023 වර්ෂයට අදාළව, ගූගල් යෙදවුම් 261 වාර්ෂික බලපත්‍ර අළුත් කිරීම සඳහා ගෙවූ රු.903,867 ක ඉදිරියට කල ගෙවීම් ජංගම වත්කම් යටතේ දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාගම සහ බදු අභියාචනා කොමිෂන් සභාව අතර ඇති කරගත් බදුකුලී ගිවිසුම අනුව, බදු අභියාචනා කොමිෂන් සභා කාර්යාල පරිශ්‍රය නවීකරණයට අදාලව මිලදී ගත්, සමාගමට හිමිකාරිත්වය නොමැති වායුසමීකරණ යන්ත්‍ර 04 කට අදාල පිරිවැය වටිනාකම් වූ රු.1,303,000 ක්, සමාගමේ දේපල පිරියත උපකරණවල, කාර්යාල උපකරණ යටතේ ගිණුම්ගත කර, සමාලෝචිත වර්ෂයට අදාලව ක්ෂය වියදම් ලෙස රු. 325,750 ක් මූල්‍ය ප්‍රකාශවල හඳුනාගෙන තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් රු.922,958 කින්ද සමාලෝචිත වර්ෂයේ අලාභය රු.325,750 කින්ද වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට බදු අභියාචනා කොමිෂන් සභාවෙන් ලැබිය යුතු රු.2,632,500ක් වූ කුලී ආදායම් වටිනාකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගෙන නොතිබුණි.

(ඌ) කුඩා හා මධ්‍ය පරිමාණ අස්පිත්ව සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (SLFRS for SMEs) පරිච්ඡේද අංක 10 හි 10.21 ඡේදය ප්‍රකාරව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට

අදාළ විගණනය විසින් පෙන්වා දුන්, සමාලෝචිත වර්ෂයේදී නිවැරදි නොකල ගිණුම්කරණ දෝෂවල වටිනාකම රු.7,966,630 ක් විය.

(එ) විවිධ ණයගැතියෝ ශේෂය රු.12,605,232 ක් ද අතැති මූල්‍ය උපකරණ ගිණුමේ ශේෂය රු.10,522,146 ක් සහ විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම් ගිණුමේ ශේෂය රු.2,083,088 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) සේවකයින් 14 දෙනෙකුගේ සේවා කාලය අඩුවෙන් ගෙන තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනය රු.701,384 ක් අඩුවෙන් සිදුකර තිබුණි.

(ඔ) කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (SLFRS for SMEs) පරිච්ඡේද අංක 21 හි 21.11 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ දිනට ප්‍රතිපාදනයන් සමාලෝචනය කිරීම හා වගකීම් පියවීම සඳහා අවශ්‍ය වන මුදල පිළිබඳව වර්තමාන හොඳම ඇස්තමේන්තුව පිළිබිඹු කිරීමට කටයුතු කිරීම අවශ්‍ය වුවද, ප්‍රතිපාදන වෙන් කිරීමෙදි සමාගමට එරෙහිව පවරා තිබූ නඩු වලින් රු.500,000,000 ක වන්දියක් ගෙවන ලෙස නියම කර තිබුණු නඩුව සඳහා සියයට 0.4 ක සාමාන්‍ය ප්‍රතිශතය අනුව ප්‍රතිපාදනය කර තිබුණි. සමාගම විසින් ඊට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනයක් ගොනු කර තිබුණු අතර මෙම අභියාචනය තුලින් සමාගමට වාසිදායක තීරණයක් ලැබීමේ සම්භාවිතාවයක් ඇති බැවින් එම ප්‍රතිශතය අනුව ප්‍රතිපාදනය වෙන් කල බවට සමාගම විසින් පිළිතුරු ලබා දී තිබුණි.

(ඕ) කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (SLFRS for SMEs) පරිච්ඡේද අංක 21 හි 21.4 ඡේදය ප්‍රකාරව ප්‍රතිපාදන සිදු කිරීමට අවශ්‍ය නිර්නායක සම්පූර්ණ කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් දිනට කම්කරු විනිශ්චය සභාව විසින් වන්දි ගෙවීම සඳහා ලබා දී තිබූ තීන්දු 4 ක් සඳහා නියම කර තිබූ රු.4,120,740 ක වන්දි මුදල් සඳහා සමාගම විසින් කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වටිනාකම් යටතේ වෙළඳ, ව්‍යවස්ථාපිත, වියදම් සහ කාර්ය මණ්ඩල නොවන ණයහිමි ශේෂවල එකතුව රු.40,976,807ක් වුවද, එම ශේෂ වලට අදාළව රු.6,997,346 ක් වූ අත්තිකාරම් ශේෂයක් හිලව් වී තිබීම නිසා එම ප්‍රමාණයෙන් ගෙවිය යුතු වටිනාකම් ශේෂය අඩුවෙන් නිරූපණය වී තිබූ අතර වසර 05 කට වඩා වැඩි පැරණි රු.2,466,902 ක ණය හිමි ශේෂ 02 ක් සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වාම දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ග) කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (SLFRS for SMEs) පරිච්ඡේද අංක 17 හි 17.19 ඡේදය ප්‍රකාරව වත්කම් වල ඵලදායී ආයු කාලය අවම වශයෙන් මුදල් වර්ෂයක් අවසානයේදී සමාලෝචනය කලයුතු අතර, අපේක්ෂා කිරීම් පෙර ඇස්තමේන්තු වලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව වෙනුවෙන් වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයේ (SLFRS for SMEs) පරිච්ඡේද අංක 10 හි 10.15 හා 10.18 ඡේදයන්ට අනුකූලව ගිණුම්ගත කල යුතු වුවද, රු.1,538,041,135 ක් වූ තවදුරටත් භාවිතා කරන, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල

පිරියත සහ උපකරණ ඒ පරිදි සමාලෝචනයක් හෝ ගිණුම්ගත කිරීමක් සිදු කර නොතිබුණි.

(ජ) කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථීත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (SLFRS for SMEs) පරිච්ඡේද අංක 21 හි 21.11 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණ දිනට පැවති ප්‍රතිපාදන සමාලෝචනය කර වගකීම් පියවීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය උදෙසා පවත්නා හොඳම ඇස්තමේන්තුව වාර්තා කිරීමට අවශ්‍ය වුවත් සමාගම විසින් 2020 හා 2021 වර්ෂවල සිදුකල රු.39,083,375 ක වෙනත් ප්‍රතිපාදන සමාලෝචනය සිදු නොකර එම වටිනාකමෙන්ම මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ට) තොග අයිතමයන් 13 කට අදාළව සමාලෝචිත වර්ෂයේ ආරම්භක හර හා බැර ශේෂයන්ගේ වෙනස්කම් පිළිවෙලින් රු.3,635,182 හා රු.2,669,967 ක් වර්ෂය අවසන් වන තෙක් නිවැරදි කිරීමට සමාගම විසින් කටයුතු කර නොතිබූ අතර අයිතම 6 කට අදාළව රු.22,806,249 කින් තොගය ඌන ගණනය වී තිබූ අතර අයිතම 5 කට අදාළව රු.5,927,633 කින් අධි ගණනය වී තිබුණි

(ඩ) මෝටර් රථ පිරිවැය ලෙස දක්වා තිබුණු රු.64,996,751 ක වටිනාකම තුල රු.3,912,781 ක් වටිනා කාර්යාල උපකරණ වටිනාකම ද ඇතුළත්කර තිබුණි.

(ණ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට ණය ගැනීම් යටතේ කොමර්ෂල් බැංකුවේ කාලීන ණය ශේෂය රු.175,502,000 ක් ලෙස දක්වා තිබුණ ද බැංකු සනාතන ලිපියේ සඳහන් ශේෂය රු.174,335,400 ක් වූ බැවින් රු.1,166,600 ක වෙනසක් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමූහයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමූහයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය

ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමූහයේ වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථීන්ව සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම් හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

විගණකාධිපතිතුමාගේ වාර්තාව

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරවකිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරවකිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වග කිව යුතුය.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්වාගනය කල මතය සඳහා පදනම කොටසේ 1.2 (ඌ) යටතේ දක්වා ඇති නිරීක්ෂණය හැර, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලය යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනත් 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයවල යොමුව	නිරීක්ෂණ
(අ) 1958 අංක 15 දරණ සේවක අර්ථ සාධක අරමුදල පනතේ 27(2)(ඒ) වගන්තිය	2019, 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා එකතුව රු.127,264,345 ක් වූ සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රමාද ගාස්තු සඳහා වූ අධිභාරය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙවා නොනිබුණි.

(ආ)	2015 ජූනි 17 දිනැති පීඊඩී/03 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.2 වගන්තිය	රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය සහ මුදල් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව, සභාපතිවරයාට සහ අධ්‍යක්ෂක මණ්ඩලයට දීමනා ගෙවා තිබුණි.
(ඇ)	1980 අංක 46 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ අංක 47 වගන්තිය හා සී/ස එස්සත් ප්‍රවෘත්ති පත්‍ර අර්ථසාධක අරමුදල් 2(vi) ඡේදය අංක 44 වගන්තිය	සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය ගණනය කිරීමට අදාළව දීමනා හා ජීවන වියදම් දීමනා සලකා නොතිබීම නිසා සමාගමේ දායකත්වය රු.40,053,954 ක් හා සේවක දායකත්වය රු.42,532,794 ක් අඩුවෙන් ද සේවක භාරකාර අරමුදල සඳහා රු.8,010,790 අඩුවෙන් ගණනය කර තිබුණි.
(ඈ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කර නොතිබුණු අතර ආයතනය විසින් අනුමත කර ගත විධිමත් ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියක් ද නොමැති බැවින් සමාලෝචිත වර්ෂයේදී සිදු කරන ලද රු.9,195,572 ක් වූ ප්‍රසම්පාදන සම්බන්ධයෙන් නහවුරුකර ගත නොහැකි විය.
(ඉ)	සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 35/11/20	අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සමාගමට බඳවාගත් සේවකයෙකු වැටුප් හා වෙතන සමාගම විසින් ගෙවීමේ පදනම මත නිදහස් කල හැක්කේ ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය හා රේඛීය අමාත්‍යාංශය වෙත පමණක් වුවද ඊට පටහැනිව ජනමාධ්‍ය අමාත්‍ය කාර්යාලය වෙත නිදහස් කර තිබූ උපදේශකවරයෙකු සඳහා උපදේශක ගාස්තු වශයෙන් රු.900,000 ක් ගෙවා තිබුණි.
(ඊ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඉ)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාල සීමාවක් තුල සියළු විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ආයතනයේ ගණන්දීමේ නිලධාරියා වගකිවයුතු වුවද 2022 නොවැම්බර් 03 දින සිට 2023 අප්‍රේල් 25 දින දක්වා නිකුත් කළ විගණන විමසුම් 12 ක් සඳහා 2023 මැයි 15 දින වන විටත් පිළිතුරු ලබාදීමට කටයුතුකර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනත් 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සමාගමේ **බලතල, කර්තව්‍ය** සහ **කාර්යයන්ට** අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2020 නොවැම්බර් 26 වන දින ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් කරන ලද ඉල්ලීමකට අනුව, 2020 දෙසැම්බර් 07 වන දින ස්වාධීන උපදේශකයෙකු සමාගමට බඳවා ගෙන තිබුණි. පසුව මෙම උපදේශකවරයා 2020 දෙසැම්බර් 08 වන දින ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය වෙත ද, 2021 අගෝස්තු 17 වන දින සෞඛ්‍ය අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය වෙත ද සේවයෙන් නිදහස් කර තිබූ අතර සමාගමට කිසිදු සේවයක් ලබා නොගෙන උපදේශක වැටුප ලෙස රු.1,800,000 ක මුදලක් සමාගම විසින් ගෙවා තිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනත් 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) 2008 දෙසැම්බර් මස සමාගම විසින් ලංකා පුවත් ලිමිටඩ් හි කොටස් 1200 ක් මිලදී ගැනීම සඳහා රු.1,200,000 ක මුදලක් වැය කර තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 වන විටත් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ආ) නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා 1985 වර්ෂයේදී මිලදී ගත් 2021 වර්ෂයේදී නැවත තක්සේරු කළ වටිනාකම රු.733,000,000 ක් වූ හෝකන්දර ප්‍රදේශයේ අක්කර 8 ක ඉඩමක් මිලදී ගත් දින සිට නිෂ්කාර්යව පවතී.

(ඇ) ආයතනයේ හිටපු අලෙවි ප්‍රධානී වගකීම් පැහැර හැරීම හේතුවෙන් ආයතනයට සිදුකළ මූල්‍ය වංචාව සම්බන්ධයෙන් සාමාන්‍ය විනය පටිපාටියෙන් බැහැරව කළමනාකරණය විසින් කටයුතු කිරීම නිසා රු.22,481,380 ක් වූ මූල්‍ය අලාභයක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) රාජ්‍ය ආයතන හා වෙනත් පෞද්ගලික ආයතන සඳහා ණය පදනම මත දැන්වීම් පල කිරීමේදී නිශ්චිත කොන්දේසි හෝ නියමිත කාල සීමාවක් නොතිබීම නිසා වසර 2 කට වඩා වැඩි කාලයක සිට නොපියවූ 189 කට අදාළ ණය ශේෂය රු.19,537,397 ක් විය.

(ඉ) 2021 වර්ෂයේ පෙබරවාරි මාසයේදී කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් රු.14,700,000 ක් වටිනා බස්රථ දෙකක් 2022 මැයි මාසයේ සිට මේ දක්වා ධාවනයේ යෙදීමට කටයුතු නොකර නිශ්කාර්යව ගාල්කර තිබුණි.

(ඊ) ඇස්තමේන්තු වාර්තා පිළියෙල කිරීම, පරීක්ෂා කිරීම හා අනුමත කිරීම යන පියවරයන් සඳහා සාමාන්‍යයෙන් වැඩ බෙදීමක් සිදු විය යුතු වුවද වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුව තුල එවැන්නක් සිදු වන බවක් විගණනයේ දී නිරීක්ෂණය නොවිණි. පිරිවැය ඇස්තමේන්තු

සකස් කිරීමේ පිළිගත් විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයක් අනුගමනය නොකරන අතර ඇස්තමේන්තු සකස් කරන පුද්ගලයාගේ අත්දැකීම් මත හා ලබාගත් පෞද්ගලික නිශ්චය කිරීම් මත මෙම කාර්යය සිදු කරනු ලබන බව නිරීක්ෂණය වූ අතර 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී වානිජ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ආදායම රු.8,451,347 ක් අඩුවී ඇති බවද නිරීක්ෂණය විය.

(උ) 1985 වර්ෂයේ දී දේපල සංවර්ධන ව්‍යාපාරයේ නිරත වීම සඳහා ලේක් හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, 2023 මැයි වන විටත් මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහයන් ජනනය වී නොතිබුණි.

(ඌ) 2017 වසරේදී උපදේශකවරියකට රු.3,150,000 ක් ගෙවා සකස් කර ගන්නා ලද මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තිය සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විටත් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර නැවත වරක් එම උපදේශකවරියම 2022 නොවැම්බර් මාසයේදී එම කාර්යයම සඳහා මාස 06ක කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන මසකට රු.150,000ක් බැගින් ගෙවා තිබූ අතර 2023 මැයි 01 දින සිට තවත් මාස 06ක කාලයක් සඳහා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි.

(එ) සේවකයන් විශ්‍රාම යාම, සේවය අවසන් කිරීම හෝ මියයාම නිසා සමාගමෙන් ඉවත්වීම හේතුවෙන්, කාලය වසර 1 සිට 22 දක්වා අයකර නොගත් එකතුව රු.7,357,501 ක් වූ ශේෂය ද සේවකයන්ගෙන් ලැබිය යුතු ශේෂය තුල දක්නට තිබුණි.

(ඒ) සමාගම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා සහ මහජනතාවට සමාගමේ ප්‍රකාශන සඳහා ග්‍රාහක මුදල් ගෙවීමට ඉඩ දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේ ග්‍රාහක ගිණුමේ දක්වන ලද හිඟ ශේෂය රු. 21,418,660 ක් විය. ඉන්, රු. 13,683,486 ක් වර්ෂ 1 සිට 11 ට වඩා හිඟව පවතින අතර මෙම හිඟ ශේෂය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඔ) 2019 වර්ෂයට පෙර නියෝජිත්වය අහෝසි කළ නියෝජිතයන් 503 ක ගෙන් රු.43,650,100 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවතුණි.

(ඕ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාගමේ වෙනත් ආදායම් සියයට 44.7 කින් අඩුවී තිබුණු අතර, විකල්ප ආදායම් ප්‍රභවයන් වර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඛ) ප්‍රධාන කාර්යාලයේ ඉදිරිපස තීන්ත ආලේප කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවේ දී සමාගම විසින් ඇස්තමේන්තු සකස් කිරීමේදී වර්ග අඩි 10650 ක් නොසලකා හැර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයට අදාළ රු.522,100 මුදලක් පැරණි කොන්ත්‍රාත් ආයතනයෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණු අතර එම නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ට) නියෝජිතයන් හට නැමිපතු ශේෂය මත පොලී ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණේ 2022 සැප්තැම්බර් මාසයේදී වුයෙන් සමාලෝචිත වර්ෂයේ නියෝජිත නැමිපතු පොළිය ජනවාරි සිට අගෝස්තු මාසය දක්වා රු.1,465,102 ක් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(ඟ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ නිෂ්පාදන සංවර්ධන වැඩසටහන, මුද්‍රණ අංශය සංවර්ධනය කිරීම සඳහා ප්‍රසම්පාදනයන් හා වැඩි දියුණු කිරීම් සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් ක්‍රියාත්මක කර නොතිබුණු අතර දැන්වීම් අංශය, ඩිජිටල් මීඩියා අංශය හා විකුණුම් අංශය සඳහා සැලසුම් අවම මට්ටමින් ක්‍රියාත්මක වීම නිසා ආයතනයේ ආදායම් වර්ධනය කර ගැනීමට හා අලාභය අවම කර ගැනීමට තිබූ අවස්ථාව මගහැරී තිබුණි.

(ඩ) ඉකුත් වසර 05ක කාලය ඊට පෙර වර්ෂය හා සැසඳිමේදී විකුණුම් පුවත්පත් සංඛ්‍යාව අඛණ්ඩව හා සීඝ්‍ර ලෙස පහත වැටී තිබුණි. පුවත්පත් අලෙවි ආදායම 2017 වර්ෂයේදී රු.මි 525ක් වූ අතර එය 2022 වර්ෂයේදී රු.මි 331ක් දක්වා අඩු වී තිබුණි. පුවත්පත් අලෙවිය වර්ධනය කිරීමට ගත යුතු උපායමාර්ගික පියවරයන් හා ක්‍රියාමාර්ග පිළිබඳව කළමණාකරනය ප්‍රමාණවත් පියවර ගැනීමට අපොහොසත් වීම නිසා පුවත්පත් විකුණුම් සංඛ්‍යාව 2017 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂය වන විට සියයට 61 කින් අඩු වී තිබුණි.

(ණ) සමාලෝචිත වර්ෂය තුලදී දැන්වීම් සදොස් ලෙස පලකිරීම නිසා එම වැරදි නිවැරදි කිරීමේ නිවේදන පලකිරීම වෙනුවෙන් භාවිතාකර තිබූ අලෙවි කල හැකිව තිබූ දැන්වීම් අවකාශයේ වටිනාකම රු.2,480,117 ක් විය.

(ත) 2017 වර්ෂයේ දී ලංකා පුවත් ලිමිටඩ් හි සේවකයින් තිදෙනෙකුගේ වැටුප් හා වේතන ලෙස ගෙවූ එකතුව රු.2,194,637 ක් 2022 දෙසැම්බර් 31 වන විටත් ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2022 දෙසැම්බර් 31 දිනට මුළු ණයගැති ශේෂය, වෙළඳ ණයගැතියන් සංඛ්‍යාව 1274 කට අදාළව ශේෂය රු.728,686,241 ක් වූ ශේෂයෙන්,වටිනාකම රු. 8,135,294 ක් වූ ණයගැතියන් 15 දෙනෙකු පමණක් සමාගමේ ණයගැති ශේෂ සමග එකහ වී තිබුණි. ණයගැතියන් 583 කට අදාළව වටිනාකම රු.204,617,890 ක ශේෂ තහවුරුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සති අන්ත පුවත්පතක් වන "සිළුමිණ" හි පළ වූ ලිපියකට අදාළව පැමිණිලිකරු සමාගමෙන් රු.මිලියන 500 ක් ඉල්ලා පවරා තිබූ නඩුවක් 2010 වර්ෂයේ කොළඹ දිසා අධිකරණයේ කැඳවූ අවස්ථාවේදී සමාගම වෙනුවෙන් පෙනී සිටි සමාගමේ නීතිඥවරයා වැරදි උසාවි කාමරයක සිටි බැවින් පැමිණිල්ලට පක්ෂව තීන්දුව ලබා දී රු.මිලියන 500 ක වන්දියක් ගෙවන ලෙස අධිකරණය නියෝග කර තිබුණි. අනතුරුව,මෙම තීන්දුව සම්බන්ධව සමාගම විසින් ශ්‍රේෂඨාධිකරණයේ අභියාචනයක් ගොනු කිරීම සඳහා රු.

18,230,000ක් නීති ගාස්තු ලෙස ගෙවීමට සිදුවී තිබුණි. මෙම නඩුව සඳහා වැරදි උසාවි කාමරයට සිටි නීතිඥවරයා විසින්ම නීතිඥවරුන් තෝරාගැනීම සිදුකර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණු අතරමේ දක්වා එම නිලධාරියාට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම නඩුව දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතී.

(ඇ) සමාගමේ ප්‍රධාන ජංගම ගිණුම ඇතුළු ගිණුම් 10 කට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශන නියමිත දිනට සකස් නොකර සැලකිය යුතු කාල ප්‍රමාදයක් සහිතව පිළියෙල කිරීම හේතුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශන සකස් කිරීමෙන් බලාපොරොත්තු වන අරමුණු ඉටු නොවන අතර ලංකා බැංකුවේ ගිණුම් අංක 377 ගිණුමේ හඳුනා නොගත් සෘජු ප්‍රේෂණ 511 කට අදාළ රු.20,684,387 ක් හා මුදල් පොතේ සටහන් වූ සෘජු ගෙවීම් අවස්ථා 25 කට අදාළව රු.20,220,216 ක් වූ අතර නිකුත් කල නමුත් උපලබ්ධි නොවූ මාස 06 ඉක්ම වූ රු.2,271,916 කට අදාළ චෙක්පත් 121 ක් නිරීක්ෂණය වූ අතර අනෙකුත් බැංකු ගිණුම් පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.27,442,442 ක් වටිනා අගරු චෙක්පත් 277 ක් තිබුණි. ඉන් රු.2,483,943 ක් වටිනා චෙක්පත් 76 ක් නිරවුල්කර ගැනීමට පියවර ගැනීමකින් තොරව පිළිවෙලින් වර්ෂ 5 කට වැඩි කාලයක් නොපියවී පැවතුණි.

(ඇ) ආයතනය සතුව පවතින බස්රථවල මගී ප්‍රවාහන මාර්ග බලපත්‍ර අංක 1551 හා 1154 සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනීමට කටයුතුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන්	සමාගම		සමූහය	
		2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපළ පිරියත හා උපකරණ	06	1,541,115	1,461,362	1,541,115	1,461,362
ආයෝජන වත්කම්	07	19,866	21,522	19,866	21,522
අස්පෘශ්‍ය වත්කම්	08	3,575	7,471	3,575	7,471
දිගුකාලීන මූල්‍ය වත්කම්	09	13,538	215,720	13,538	215,720
ඒකාබද්ධයන්හි ආයෝජන	10	7,500	7,500	-	-
විලම්බිත බදු වත්කම්	11	69,276	69,276	69,276	69,276
සැලසුම් වත්කම්	23	309,611	246,538	309,611	246,538
සේවකයන්ගෙන් අයවිය යුතු දෑ	14	54,051	77,297	54,051	77,297
මුළු ජංගම නොවන වත්කම්		**2,018,533**	**2,106,685**	**2,011,032**	**2,099,185**
ජංගම වත්කම්					
තොග	12	327,383	423,980	327,383	423,980
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	13	652,212	801,317	670,886	820,009
සේවකයන්ගෙන් අයවිය යුතු දෑ	14	51,872	45,096	51,872	45,096
ජංගම බදු වත්කම්	28	8,120	19,667	8,120	19,667
මුදල් හා මුදලට සමාන වත්කම්	15	272,163	32,695	272,163	32,695
මුළු ජංගම වත්කම්		**1,311,751**	**1,322,755**	**1,330,424**	**1,341,447**
මුළු වත්කම්		**3,330,284**	**3,429,440**	**3,341,457**	**3,440,633**
හිමිකම් හා වගකීම්					
හිමිකම්					
අනුදත් ප්‍රාග්ධනය	16	34,837	34,837	34,837	34,837
ප්‍රත්‍යාගණන සංචිත		1,405,004	1,284,029	1,405,004	1,284,029
රඳවාගත් ආදායම		319,022	516,380	330,185	527,543
මුළු හිමිකම්		**1.758,864**	**1,835,246**	**1,770,027**	**1,846,410**
වගකීම්					
ජංගම නොවන වගකීම්					
තැන්පතු	17	176,472	184,349	176,472	167,343
ණය	18	171,293	253,135	171,293	253,135
කල්බදු ණය හිමියෝ	19	8,387	11,274	8,387	11,274
සේවක ප්‍රතිලාභ බැඳියාවන්	20	59,840	51,844	59,840	51,844
ආයතනයට එරෙහි නඩු සඳහා වෙන්කිරීම්	23	769,628	676,350	769,628	676,350
මුළු ජංගම නොවන වගකීම්		**1,185,620**	**1,176,953**	**1,185,620**	**1,159,947**
ජංගම වගකීම්					
ණය	18	178,004	238,239	178,004	238,239
කල් බදු ණය හිමියෝ	19	2,887	2,887	2,887	2,887
වෙන්කිරීම් - වෙනත්	21	56,588	39,084	56,588	39,084
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	22	148,321	137,032	148,331	154,068
මුළු ජංගම වගකීම්		**385,800**	**417,242**	**385,810**	**434,277**
මුළු වගකීම්		**1,571,420**	**1,594,195**	**1,571,430**	**1,594,224**
මුළු හිමිකම් හා වගකීම්		**3,330,284**	**3,429,440**	**3,341,457**	**3,440,633**

මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇති සියලුම කොටස් මනාව හැඩගස්වා ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන 2007 සමාගම් පනතේ අංක 07 අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි සකස් කර ඇති බවට සහතික කරමි.

විරාජිත් බොයිස් - අතිරේක සාමාන්‍යාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව වගකියනු ලැබේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

අනුෂ පැල්පිට
සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂක
2022 පෙබරවාරි 23 දින,
කොළඹ.

මහාචාර්ය හරේන්ද්‍ර කාරියවසම්
අධ්‍යක්ෂක - මූල්‍ය

ජනක රණතුංග
අධ්‍යක්ෂක - නීති හා පරිපාලන

විස්තරාත්මක ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන	සමාගම		සමූහය	
		2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
ආදායම	24	1,854,347	2,217,890	1,854,347	2,217,890
විකුණුම් පිරිවැය		(844,851)	(928,349)	(844,851)	(928,349)
දළ ලාභය		1,009,497	1,289,541	1,009,497	1,289,541
වෙනත් ආදායම්	25	275,976	499,247	275,976	499,247
		1,285,473	1,788,788	1,285,473	1,788,788
පරිපාලන වියදම්		(1,025,945)	(1,001,331)	(1,025,944)	(1,001,340)
බෙදාහැරීමේ වියදම්		(375,648)	(309,885)	(375,648)	(309,885)
මෙහෙයුම් ලාභය	26	(116,120)	477,573	(116,119)	477,563
මූල්‍ය වියදම්		(75,817)	(53,608)	(75,817)	(53,608)
ස්වෙච්ඡාවෙන් විශ්‍රාම යාමට පෙර ලාභය		(191,937)	423,965	(191,936)	423,955
ස්වෙච්ඡාවෙන් විශ්‍රාම යාමේ පිරිවැය	27	-	(91,952)	-	(91,952)
බදු හා සාධාරණ අගය ගැලපීමට පෙර ලාභය		(191,937)	332,012	(191,936)	332,002
බදු වියදම	28	-	4,480	-	4,480
සාධාරණ අගය ගැලපීම		(5,421)	8,971	(5,421)	8,971
වසරේ ලාභය		**(197,358)**	**345,464**	**(197,357)**	**345,454**
ආරෝපිත ලාභය මුල් හිමිකරුවන්ට		**(197,358)**	**345,464**	**(197,357)**	**345,454**
වෙනත් විස්තීර්ණ ආදායම්					
ඉඩම් ප්‍රත්‍යාගණනය		-	1,284,029	-	1,284,029
මෝටර් වාහන ප්‍රත්‍යාගණනය		120,975	-	120,975	-
මුළු විස්තීර්ණ ආදායම්		**(76,383)**	**1,629,493**	**(76,382)**	**1,629,483**
ආරෝපිත ලාභය මුල් හිමිකරුවන්ට		**(76,383)**	**1,629,493**	**(76,382)**	**1,629,483**

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

සමාගම

කොටස් ප්‍රාග්ධනය	කොටස් ප්‍රාග්ධනය රු. '000	ප්‍රත්‍යාගණන සංචිත රු. '000	රඳවාගත් ඉපැයීම් රු. '000	එකතුව රු. '000
2021.01.01 දිනට ශේෂය	34,837	-	170,916	205,752
2021 වර්ෂය සඳහා ලාභය;	-	-	345,464	345,463
ඉඩම් ප්‍රත්‍යාගණනය	-	1,284,029	-	1,284,028
ලාභාංශ	-	-	-	-
2021.12.31 දිනට ශේෂය	**34,837**	**1,284,029**	**516,380**	**1,835,245**
2022.01.01 දිනට ශේෂය	-	-	(197,358)	(197,358)
මෝටර් වාහන ප්‍රත්‍යාගණනය	-	120,975	-	120,975
ලාභාංශ	-	-	-	-
2022.12.31 දිනට ශේෂය	**34,837**	**1,405,004**	**319,022**	**1,758,862**

සමූහය

	කොටස් ප්‍රාග්ධනය රු. '000	ප්‍රත්‍යාගණන සංචිත රු. '000	රඳවාගත් ඉපැයීම් රු. '000	එකතුව රු. '000
2021.01.01 දිනට ශේෂය	34,837	-	182,089	216,929
2021 වර්ෂය සඳහා ලාභය	-	-	345,454	345,454
ඉඩම් ප්‍රත්‍යාගණනය	-	1,284,029	-	1,284,029
ලාභාංශ	-	-	-	-
2021.12.31 දිනට ශේෂය	**34,837**	**1,284,029**	**527,542**	**1,846,412**
2022 වර්ෂය සඳහා ලාභය	-	-	(197,357)	(197,357)
මෝටර් වාහන ප්‍රත්‍යාගණනය	-	120,975	-	120,975
ලාභාංශ	-	-	-	-
2022.12.31 දිනට ශේෂය	**34,837**	**1,405,004**	**330,185**	**1,770,030**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන්	සමාගම		සමූහය	
		2022 රු. '000	2021 රු. '000	2022 රු. '000	2021 රු. '000
බදු හා සාධාරණ අගය ගැලපීමට පෙර ශුද්ධ ලාභය		**(191,937)**	**332,012**	**(191,936)**	**332,002**
ගැලපීම					
ක්ෂය / ක්‍රමක්ෂය		62,429	62,178	62,429	62,178
වෙළෙඳ හා වෙනත් ලැබීම් සඳහා වෙන් කිරීම්		24,871	13,262	24,871	13,262
ආයතනයට එරෙහි නඩු වෙනුවෙන් වෙන් කිරීම්		7,996	26,924	7,996	26,924
වෙන්කිරීම් - වෙනත්		17,505	29,905	17,494	29,905
ආදායම් බදු කපා හැරීම		11,547	15,401	11,547	15,401
පාරිතෝෂික වෙන් කිරීම්		120,771	113,793	120,771	113,793
මූල්‍ය වියදම්		75,817	53,608	75,817	53,608
කුලී ආදායම		(77,922)	(74,024)	(77,922)	(74,024)
පොලී ආදායම		(58,021)	(15,723)	(58,021)	(15,723)
ලාභාංශ ආදායම්		(5,335)	(8,109)	(5,335)	(8,109)
දේපළ යන්ත්‍ර හා උපකරණ විකිණීමෙන් (ලාභ)/(පාඩු)		-	(1,267)	-	(1,267)
කොටස් විකිණීමෙන් (ලාභ) / (පාඩු)		(7,145)	-	(7,145)	-
කාරක ප්‍රාග්ධනය ගැළපීමට පෙර මෙහෙයුම් මුදල් ප්‍රවාහය		**(19,425)**	**547,961**	**(19,434)**	**547,951**
කාරක ප්‍රාග්ධන වෙනස්කම්					
තොග (වැඩිවීම) / අඩුවීම		96,597	(102,407)	96,597	(102,407)
වෙළඳ හා වෙනත් ලැබීම්වල (වැඩිවීම) / අඩුවීම		166,324	(56,311)	166,324	(56,311)
වෙළඳ හා වෙනත් ගෙවීම්වල වැඩිවීම/ (අඩුවීම)		43,509	(83,192)	43,518	(83,182)
මෙහෙයුමෙන් ජනිතවූ මුදල් ප්‍රවාහය		**287,006**	**306,052**	**287,006**	**306,051**
පොලී ගෙවීම්		(75,742)	(53,628)	(75,742)	(53,628)
ගෙවීම් - වෙනත් වෙන් කිරීම්		-	(18,085)	-	(18,085)
පාරිතෝෂික ගෙවීම්		(29,576)	(142,146)	(29,576)	(142,146)
ආදායම් බදු ගෙවීම්		-	-	-	-
ආයතනයට එරෙහිව පවරා ඇති නඩු වෙනුවෙන් ගෙවීම්		-	-	-	-
මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය		**181,687**	**92,193**	**181,688**	**92,193**
ආයෝජන කටයුතු					
දේපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම		(20,271)	(35,096)	(20,271)	(35,096)
දේපළ පිරියත හා උපකරණ විකිණීම		-	1,267	-	1,267
අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනීම		(354)	-	(354)	-
සැලසුම් වත්කම්වල වැඩිවීම / (අඩුවීම) - පාරිතෝෂික භාර අරමුදල		(63,073)	(45,334)	(63,073)	(45,334)
කුලී ආදායම්		43,648	81,706	43,648	81,706
ලද පොලිය		46,519	15,723	46,519	15,723
ලද ලාභාංශ		5,335	8,109	5,335	8,109
කොටස් විකිණීමෙන් ලද මුදල		203,906	-	203,906	-
ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය		**215,710**	**26,374**	**215,710**	**26,374**
මූල්‍ය කටයුතු					
වර්ෂය තුළදී ලබාගත් ණය		-	140,000	-	140,000
වර්ෂයේ ණය ගෙවීම්		(86,828)	(101,316)	(86,828)	(101,316)
මූල්‍ය කල්බදු		-	16,170	-	16,170
කල්බදු නැවත ගෙවීම්		(2,887)	(2,010)	(2,887)	(2,010)
මූල්‍ය කටයුතු තුළින් මුදල් ප්‍රවාහය		**(89,715)**	**52,844**	**(89,715)**	**52,844**
මුදල් හා මුදලට සමාන වත්කම් වල ශුද්ධ වෙනස		**307,682**	**171,411**	**307,683**	**171,411**
ජනවාරි 01 දිනදී මුදල් හා මුදලට සමාන වත්කම්		**(93,626)**	**(265,036)**	**(93,626)**	**(265,036)**
දෙසැ. 31 දිනදී මුදල් හා මුදලට සමාන වත්කම්	**15**	**214,057**	**(93,626)**	**214,057**	**(93,626)**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.1 පොදු

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සීමිත වගකීමෙන් යුත් සමාගමක් වන අතර, එහි නිත්‍ය වාසස්ථානය ශ්‍රී ලංකාවේ පිහිටා ඇත. ලියාපදිංචි කාර්යාලය කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටා ඇති අතර, එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථාන හා ලිපිනයන් පහත දැක්වෙන පරිදි වේ.

1.	මහනුවර ශාඛාව	:	අංක 99, D.S. සේනානායක මාවත, මහනුවර.
2.	කතරගම ශාඛාව	:	ශ්‍රී රේවත මාවත, කතරගම.
3.	මාතර ශාඛාව	:	අංක 29, 30, 31, නව මගී බස් නැවතුම්පළ සාප්පු සංකීර්ණය, මාතර.
4.	අනුරාධපුර ශාඛාව	:	හරිස්චන්ද්‍ර මාවත, නව නගරය, අනුරාධපුර.
5.	යාපනය ශාඛාව	:	අංක 06, සිම්පියාඩි මාවත, ඕෆ් ස්ටැන්ලි මාවත, යාපනය.

2022 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට මව් සමාගම සහ එහි අනුබද්ධ (පරිපාලිත) ආයතන අන්තර්ගත වනු ඇත. (මින් මතුව පොදුවේ "සමූහය" ලෙස හඳුන්වනු ලැබේ)

1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

මව් සමාගම

මූල්‍ය වර්ෂය තුළදී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ පුවත්පත්, වාර ප්‍රකාශන, සඟරා යනාදිය මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීමත් සහ වාණිජ මුද්‍රණ කටයුතුවල නිරත වීමත්ය. සමාගම සතුව, ආයතනික මූලස්ථානය හා මුද්‍රණ යන්ත්‍රාගාර / පිරියත හෙවත් මුද්‍රණාලය කොළඹ පිහිටා ඇති අතර, අලෙවි කටයුතු ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාව තුළම සිදු කරනු ලැබේ.

පරිපාලන ආයතන :

වර්ෂය තුළ මෙකී පරිපාලිත සමාගම්වල ප්‍රධානතම ක්‍රියාකාරකම් පහත දක්වා ඇති අයුරින් සිදුකරනු ලැබ ඇත.

- **ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම**

  සමාගම විසින් එහි පූර්ණ හිමිකාරිත්වය දරන අනුබද්ධ සීමාසහිත ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම යන නාමයෙන් යුක්තව 1985 දී දේපළ සංවර්ධන ව්‍යාපාර කටයුතු වලට විවිධාංගීකරණය කිරීමේ අරමුණින් ස්ථාපනය කරනු ලැබූ නමුත්, තවමත් එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සිදු කර නොමැත.

2. ඉදිරිපත් කිරීමේ පදනම

මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධයේ වෙනස්වීම හෙවත් විචලනය පිළිබඳ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රවාහයන් පිළිබඳ ප්‍රකාශය ඇතුළත් සමාගම් සමූහයේ 2022 දෙසැම්බර් 31 ට ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් සමග (එනම් මූල්‍යමය ප්‍රකාශයන්) සහිත 2022 දෙසැම්බර් මස 31 වන දිනට සහ එකී එදින අවසන් වන වර්ෂය සඳහා සමූහයේ මූල්‍යමය තත්ත්වයන් හා තොරතුරු ඇතුළත් "මූල්‍ය ප්‍රකාශ" ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ICASL) විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර තත්ත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා තත්ත්වයන්ට අනුකූලව පිළියෙල කර ඇත. (මින්මතු "SME" සඳහා SLFRS යනුවෙන් හඳුන්වනු ලැබේ).

මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබ ඇති අතර, සියලුම ශ්‍රී ලංකා රුපියල් මගින් ඉදිරිපත් කරන ලද මූල්‍යමය තොරතුරු ආසන්නතම දහසට දක්වා ඇත.

2.1.1. අනුකූල වීමේ ප්‍රකාශය

සමාගම් සමූහයේ, ඒකාබද්ධිත මූල්‍ය ප්‍රකාශ කුඩා හා මධ්‍යම ව්‍යවසායයන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රකාශය (SLFRS for SMES) වලට අනුගතව හා අනුකූලව පිළියෙල කරනු ලැබ ඇත. මෙකී මූල්‍යමය ප්‍රකාශයන් 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත් කර ඇත.

2.1.2 දිගින් දිගටම පැවැතීම

අධ්‍යක්ෂකවරුන් විසින් සාර්ථක ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස ආයතන සමූහය, අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා එයට ඇති හැකියාව තක්සේරුවක් කර ඇති අතර, ආයතනය ඈවර කරනු ලැබීමට හෝ වෙළෙඳ කටයුතු අත්හිටුවීමට හෝ නතර කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අදහස් කර නොමැත.

3. ඒකාබද්ධ කිරීමේ පදනම

ඒකාබද්ධ කළ මූල්‍ය ප්‍රකාශන තුළ 2022 දෙසැම්බර් මස 31 වන දිනට සමාගම් සමූහයේ හා එහි අනුබද්ධිත සමාගම්වල මූල්‍යමය ප්‍රකාශ අන්තර්ගතව ඇත.

අනුබද්ධ පරිපාලිත සමාගම්, සමාගම පාලනය ලබාගත් දින සිට එනම් සංස්ථාපනය හෙවත් ඒකාබද්ධයෙහි දින ඒකාබද්ධ කරනු ලබන දින දක්වා පවතින අතර, එම පාලනය අවසන් වන හෙවත් නතර වන දිනය දක්වා ඒකාබද්ධව පවතිනු ඇත. පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ස්ථිර සාර ගිණුම් ප්‍රතිපත්ති භාවිත කරනු ලබන අතර, එකී වාර්තා මව් සමාගමේ ප්‍රකාශන පිළියෙල කරනු ලබන කාල පරිච්ඡේදයටම පිළියෙල කරනු ලැබේ.

සමූහයේ සමාගම් අතර සිදු කළ යථාවත් නොකළ ලැබීම් හෙවත් ලාභ හා අලාභ නොසලකා ඇත. අන්තර් සාමූහික වත්කම් විකිණුම් මත වන යථාවත් නොකළ අලාභ, ඒකාබද්ධකරණයේදී ප්‍රතිවර්තය කරනු ලැබ එහි යටින් දිවෙන හා පවතින වත්කම්ද හානිවීම සඳහා පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. සමූහය විසින් උපුටා ගනු ලබන ගිණුම් ප්‍රතිපත්ති සමඟ තිරසාර ගැළපීම තහවුරු කෙරෙන වස්, අවශ්‍ය අවස්ථාවන්හිදී ගැළපීමට හා සීරුමාරු කරනු ලැබීම කෙරිනි. එම සංඛ්‍යාවන් ගිණුම්ගත ප්‍රමාණය වාර්තා කරනු ඇත.

4. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

4.1 විදේශ මුදල් වර්ග පරිවර්තනය කිරීම

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලබන අතර, ඒවා සමූහයේ කාර්යමය, ශ්‍රිතමය, ක්‍රියාකාරිත්වයේ හා ඉදිරිපත් කරලීමේ මුදල් වර්ගය වනු ඇත. විදේශ මුදල් වර්ගයන්හි ගනුදෙනු එකී ගනුදෙනුවල සටහන් දිනයට ක්‍රියාත්මක ව පවතින ක්‍රියාකාරී මුදල් වර්ගවල අනුපාතයන්හි නියමයට අනුගතව සිදුවනු ඇත. මූල්‍ය වත්කම් හා වගකීම් හෙවත් බැරකම් එනම් ශේෂපත්‍රයන්හි දිනයට විදහා දැක්වෙන හෙවත් ප්‍රදර්ශනය කරන ලද විනිමය මුදල් වර්ග, නැවතත් පරිවර්තනය කරගත හැකිය.

4.2 බදු

වර්තමාන බදු

ප්‍රවර්තන බදු පවත්නා සහ පූර්ව කාලපරිච්ඡේදවලට අදාළ ප්‍රවර්තන ආදායම් බදු වත්කම් සහ වගකීම්, නැවත අයකර ගැනීමට අපේක්ෂිත වටිනාකම් හෝ බදු අධිකාරීන් හට ගෙවිය යුතු වටිනාකම් මත තක්සේරු කරනු ලැබේ. එම වටිනාකම් ගණනය කිරීමට යොදාගනු ලබන බදු, අනුපාත සහ බදු නියමයන් නීතිගත කර හෝ ශේෂ පත්‍ර දිනට සැළකිය යුතු ලෙස නීතිගත කරනු ලැබේ.

දේශීය ආදායම් පනතෙහි දක්වා ඇති විධිවිධාන අනුව ගණනය කොට මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරන ලද ආදායම් සහ වියදම් අංගයන් පදනම් කරගෙන ආදායම් බදු සඳහා ප්‍රතිපාදන සිදු කර ඇත. වෙනත් විස්තරාත්මක ආදායමක් ලෙස හඳුනාගත්, ආදායම් හෝ වියදම් අයිතමයකට අදාළ වෙනසක් සෘජුවම වෙනත් විස්තරාත්මක ආදායමක් ලෙස හඳුනා ගැනීමත් හැරුණු විට බදු ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

විලම්භිත බදු

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම්වලට අදාළව බදු පදනම් සහ ඒවායෙහි පවත්නා අගය අතර පවතින තාවකාලික වෙනස්කම් මත වගකීම් විධික්‍රමය උපයෝගී කර ගනිමින් විලම්භිත ආදායම් බදු සඳහා ප්‍රතිපාදන සිදු කරනු ලැබේ.
විලම්භිත ආදායම් බදු වගකීම ව්‍යාපාර ඒකාබද්ධ කිරීමක් නොවන ගනුදෙනුවක වත්කමක් හෝ වගකීමක මූලික හඳුනා ගැනීමකදී හටගනු ලබන විලම්භිත ආදායම් බදු සහ අදාළ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම් කරන ලාභයට හෝ බදු අය කළ හැකි ලාභ හෝ පාඩුවලට බලපෑමක් ඇති නොවන අවස්ථාවකදී හැරුණු විට සියලුම බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත ආදායම් බදු වගකීම් හඳුනා ගනු ලැබේ.

අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්වලට අදාළ විලම්භිත ආදායම් බදු වත්කම් ව්‍යාපාර ඒකාබද්ධ කිරීමක් නොවන ගනුදෙනුවක වත්කමක් හෝ වගකීමක මූලික හඳුනාගැනීමකදී සහ අදාළ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම් කරන ලාභයට හෝ බදු අය කළ හැකි ලාභ හෝ පාඩු වලට බලපෑමක් ඇති නොවන අවස්ථාවකදී හැරුණු විට සහ අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් ප්‍රයෝජනයට නොගත් ඉදිරියට රැගෙන ආ බදු වත්කම් සහ ප්‍රයෝජනයට නොගත් බදු පාඩු උපයෝජනය කිරීම සඳහා බදු අය කළ හැකි ලාභ පවතින බවට සසම්භාවී වන විටදී ඉදිරියට නොගත් බදු පාඩුවලට අදාළ සියලුම අයකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලැබේ.

විලම්භිත බදු වත්කම් පූර්ණ හෝ අර්ධ වශයෙන් උපයෝජන කිරීම සඳහා ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභ නොපවතින බවට තවදුරටත් සසම්භාවී වන විටදී වාර්තා කරනු ලබන සෑම වර්ෂයක් තුළදීම විලම්භිත ආදායම් බදු වත්කම්වල පවත්නා අගය විමර්ශනය කරනු ලැබේ.

විලම්භිත බදු වත්කම් ආපසු ලබා ගැනීම සඳහා අනාගත බදු අයකළ හැකි ලාභ පවතින බව සසම්භාවී වන විටදී හඳුනා නොගත් විලම්භිත බදු වත්කම්වල පවත්නා අගය සෑම වර්ෂයකම වාර්තා කරනු ලබන දිනයේදී නැවත තක්සේරු කරනු ලබයි.

අදාළ වත්කම විකුණා ලබන වර්ෂයට අදාළ අපේක්ෂිත අනුපාතිකය හෝ අදාළ වගකීම පියවීමට අපේක්ෂිත අනුපාතිකය වාර්තා කරනු ලබන දිනට ප්‍රඥප්ති හෝ සැලකිල්ලට ගනු ලබන බදු අනුපාතික සහ බදු නීති යනාදිය මත විලම්භිත ආදායම් බදු වත්කම් සහ වගකීම් මිනුම් කරන ලදී.

හඳුනා නොගත් විලම්භිත බදු වත්කම් වාර්තා කරන සෑම දිනකම නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අයකර ගත හැකි ලාභය විලම්භිත බදු වත්කම් යථා තත්ත්වයට පත් කිරීමට ඉඩ සලසන සම්භාවිතාව දක්වා හඳුනාගෙන ඇත.

4.3 ණය ගැනීමේ පිරිවැය

අපේක්ෂිත පරිහරණය තෙක් සූදානම් කිරීම සඳහා හෝ විකිණීම සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගත වන වත්කමක් සඳහා අදාළ මිලදී ගැනීමේදී, ඉදිකිරීමේදී හෝ නිෂ්පාදනය කිරීමේදී සෘජුවම ආරෝපණය කළ හැකි ණය ගැනීමේ පිරිවැය අදාළ වත්කමෙහි පිරිවැයට අයත් කොටසක් ලෙස ප්‍රාග්ධනීත කරනු ලැබේ. අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය එම පිරිවැය දරනු ලබන කාලසීමාවට අදාළ වියදමක් ලෙස සලකනු ලබන මුදල් ණයට ගැනීමට අදාළව දරනු ලබන පොලී සහ වෙනත් වියදම් ණය ගැනීමේ පිරිවැය තුළ අන්තර්ගත වේ.

4.4 තොග

යල්පැනගිය සහ මන්දගාමී ලෙස චලනය වන අයිතම සඳහා ඉඩ හැරීමෙන් පසුව පවතින පිරිවැයෙහි හෝ ශුද්ධ විකුණුම් අගයෙහි අවම අගය මත තොග තක්සේරු කරනු ලැබේ. ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ පිරිවැය සහ විකිණීම සඳහා අනිවාර්යයෙන් දැරිය යුතු පිරිවැය ඉවත් කිරීමෙන් පසුව පවතින අගය ශුද්ධ විකුණුම් පිරිවැය ලෙස සලකනු ලබයි. පිරිවැය තීරණය කිරීම ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් ක්‍රමය මත (මුද්‍රණ කඩදාසි හැර) සිදුවේ.තොග අගය අඩුවීමේ හානි අප්‍රමාදව ලාභ අලාභ ගිණුමෙහි හඳුනාගනු ලැබේ.

4.5 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන අධි ද්‍රවශීල ආයෝජන, වටිනාකම වෙනස්වීමේ ඉතා අල්ප අවදානමක් සහිත ගම්‍ය වූ මුදල් වටිනාකම්වලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි දෑ මුදල් සහ මුදල් සමාන දෑ ලෙස හැඳින්විය හැකිය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දෑ තුළ අතැති මුදල් සහ හිඟව පවතින බැංකු අයිරා අඩු කිරීමෙන් පසුව ඉතිරි වන බැංකු තැන්පතු අන්තර්ගත වේ. මිලදී ගනු ලැබූ දිනයේ සිට මාස 3 ක් හෝ ඊට අඩු කෙටි කල් පිරීමේ කාලයක් සහිත ආයෝජනද මුදල් සමාන දෑ ලෙස සැලකේ.

4.6 දේපළ යන්ත්‍ර හා උපකරණ

පිරිවැය

එදිනෙදා නඩත්තු සේවා පිරිවැය, සමුච්චිත ක්ෂය වීම් සහ සමුච්චිත අගය අඩුවීමේ අගය අඩු කිරීමෙන් පසුව පවතින පිරිවැය අගයට දේපළ, යන්ත්‍ර හා උපකරණ පවත්වා ගෙන යනු ලැබේ. හඳුනාගැනීමේ උපමානයන් සම්පූර්ණ වන්නේ නම් එවැනි පිරිවැය තුළ අදාළ පිරිවැය දරන අවස්ථාවේදී යන්ත්‍ර සහ උපකරණවල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ඇතුළත් වේ.

ක්ෂය වීම

ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය මුළුල්ලෙහි වත්කම්වල පිරිවැය, එම වත්කම්වල ශුද්ධ අගය අඩු කිරීමෙන් පසුව පවතින අගය බෙදා හැරීම සඳහා සරල මාර්ග ක්‍රමය මත ක්ෂය අයකිරීම සිදු කරනු ලබයි. දේපළ, යන්ත්‍ර හා උපකරණ ක්ෂය කිරීම සඳහා පහත සඳහන් වාර්ෂික අනුපාත උපයෝගී කරගනු ලැබේ.

ගොඩනැගිලි - පැරණි	අවුරුදු 25
ගොඩනැගිලි - නව	අවුරුදු 20
යන්ත්‍ර හා උපකරණ	අවුරුදු 08
මෝටර් රථ	අවුරුදු 04
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	අවුරුදු 08
පරිගණක හා උපාංග	අවුරුදු 04
වායු සමීකරණ	අවුරුදු 04

කිසියම් වත්කමක් ක්ෂය කිරීම එම වත්කම ප්‍රයෝජනය සඳහා භාවිත කරන විට ආරම්භ වන අතර, අදාළ වත්කම හඳුනාගැනීමක් නොවන අවස්ථාවේදී ක්ෂය කිරීම අවසන් වේ. ක්ෂය අනුපාතයෙහි, ඵලදායී ජීව කාලයෙහි හෝ වත්කමෙහි ශුද්ධ අගයෙහි සැලකිය යුතු වෙනසක් පවතින බවට හැඟවීමක් තිබෙන විට නව අපේක්ෂාවන් දැක්වීම සඳහා අදාළ වත්කමෙහි ක්ෂය පෙර දක්නා ලෙස ප්‍රතිශෝධනය කරනු ලැබේ.

ප්‍රාග්ධනයට අදාළ නොනිමි වැඩ

ප්‍රාග්ධනයට අදාළ නොනිමි වැඩ පිරිවැයට දක්වා ඇත. මෙම වියදම් දිගු කාලීන ප්‍රාග්ධන ව්‍යාපෘතිවල සෘජුවම ඇතුළත් ඉදිකිරීම් කටයුතුවලට අදාළ වියදම් වේ. ව්‍යාපෘති අවසන් වී අදාළ වත්කම් ප්‍රයෝජනයට සුදුසු වන තෙක් දරනු ලබන ප්‍රාග්ධන ගණයට අයත් වියදම් ප්‍රාග්ධනයට අදාළ නොනිමි වැඩ ලෙස ගිණුම් ගත වේ.

ප්‍රත්‍යාගණනය

සමාගම සතු සියලුම ඉඩම් 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණය කරන ලද අතර ඉදිරියට ගෙන යා හැකි වටිනාකම රුපියල් මිලියන 1,287 (2020 - රුපියල් මිලියන 3.8) විය.

ප්‍රත්‍යාගණනයට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන අංක 6 හි දක්වා ඇත.

සමාගම සතු සියලුම මෝටර් වාහන 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කරනලද අතර ඉදිරියට ගෙන යා හැකි වටිනාකම රුපියල් මිලියන 113.4 (2021 - රුපියල් මිලියන 17.9) විය. ප්‍රත්‍යාගණනයට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන අංක 6 හි දක්වා ඇත.

හඳුනාගැනීමෙන් ඉවත් කිරීම

ආරම්භයේදී හඳුනාගත් දේපළ යන්ත්‍ර හා උපකරණවලට අදාළ කිසියම් අයිතමයක් විකිණීමේදී හෝ එම වත්කම භාවිතයේදී හෝ විකිණීමේදී අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ නොමැති අවස්ථාවකදී එම වත්කම හඳුනාගැනීමෙන් ඉවත් කරනු ලැබේ. එවැනි හඳුනාගැනීමෙන් ඉවත් කිරීමකදී හටගනු ලබන කිසියම් ලාභයක් හෝ පාඩුවක් (වත්කමෙහි පවත්නා අගය සහ ශුද්ධ විකුණුම් ආදායම් අතර වෙනස) අදාළ වත්කම හඳුනාගැනීමෙන් ඉවත් කිරීමේදී ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කරනු ලැබේ.

ආයෝජන වත්කම් සඳහා නැවත වර්ග කිරීම

කිසියම් වත්කමක භාවිතය අයිතිකරු සතුව තිබී ආයෝජන වත්කමක් ලෙස පරිවර්තනය වන අවස්ථාවකදී අදාළ වත්කම ආයෝජන වත්කම් ලෙස නැවත වර්ග කර පිරිවැය අගයට දක්වනු ලැබේ.

4.7 ආයෝජන වත්කම්

කුලී ආදායම් ඉපයීම හෝ ප්‍රාග්ධන ඇගයීම හෝ මෙම කරුණු දෙකම සඳහා රඳවා ගනු ලබන වත්කම් ආයෝජන වත්කම් වන අතර, මෙම වත්කම් සාමාන්‍ය ව්‍යාපාර චර්යාව තුළ විකිණීම සඳහා නිෂ්පාදන කටයුතු සඳහා යොදාගැනීමට හෝ පරිපාලන කටයුතු සඳහා භාණ්ඩ හා සේවා සැපයීම සඳහා යොදා ගනු නොලැබේ.

සමුච්චිත ක්ෂය සහ සමුච්චිත අගය අඩුවීම් අඩු කිරීමෙන් පසුව පවතින පිරිවැයට ආයෝජන වත්කම් තක්සේරු කරනු ලැබේ. ආයෝජන වත්කම් මිලදී ගැනීම සඳහා සෘජුවම ආරෝපණ කළ හැකි වියදම් මෙම පිරිවැය තුළ අන්තර්ගත වේ. ස්වයංව ගොඩනංවන ලද ආයෝජන වත්කම්වල පිරිවැය තුළ අදාළ ආයෝජන වත්කම් එම වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජනය සඳහා යොදාගත හැකි තත්ත්වයට පත් කිරීමට සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් වියදම් ද්‍රව්‍ය පිරිවැය සහ ශ්‍රම පිරිවැය යනාදිය ඇතුළත් වන අතර, ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනිත කරනු ලැබේ.

කිසියම් ආයෝජන වත්කමක් විකිණීමේදී ස්ථිර ලෙස භාවිතයෙන් ඉවත් කරන අවස්ථාවකදී සහ අදාළ වත්කම විකිණීමෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොමැති අවස්ථාවකදී අදාළ ආයෝජන වත්කම් හඳුනාගැනීමෙන් ඉවත් කෙරේ. අදාළ වත්කමේ පවත්නා අගය සහ ශුද්ධ විකුණුම් ආදායම් අතර වෙනස (අදාළ වත්කම හඳුනාගැනීමෙන් ඉවත් කරන ලද කාලපරිච්ඡේදයට අයත්) ලාභ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

ආයෝජන වත්කම්වලට සිදු කරනු ලබන මාරු කිරීම් හෝ ආයෝජන වත්කම් වලින් සිදු කරනු ලබන මාරු කිරීම් අදාළ වත්කම භාවිතයේ ඇති වන වෙනසකදී පමණක් සිදු කරනු ලැබේ. ආයෝජන වත්කම් සහ අයිතිකරු සතුව පැවති වත්කම් අතර සිදු වන හුවමාරු මඟින් අයිතිකරු සතුව පැවති වත්කම් වලින් ආයෝජන වත්කම් ලෙස පරිවර්තනය වීමේදී පවත්නා අගය නොවෙනස්ව පසුව එළැඹෙන ගිණුම්කරණ අවශ්‍යතා සඳහා දරනු ලබන පිරිවැයක් ලෙස සැලකේ.

4.8 කල්බදු වත්කම්

සමූහ ව්‍යාපාරයට කල්බදු වත්කම්වල හිමිකමේ සියලුම අවදානම් ප්‍රදානයන් සත්‍ය ලෙස පවරන්නේ නම් කල්බද්දක් මූල්‍ය කල්බද්දක් ලෙස වර්ග කළ හැකිය. අදාළ වත්කම් කල්බදු වත්කමේ සාධාරණ වටිනාකමට හෝ කල් බදු ගෙවීමේ වර්තමාන වටිනාකමට අඩුනම් අමතර පිරිවැයත් සමග ආරම්භයේ දී හඳුනාගනී. ලේඛනගත වටිනාකම මූල්‍යමය කල්බදු ගෙවීම වගකීම වශයෙන් හඳුනාගනී. සමූහ ව්‍යාපාරයට නීත්‍යානුකූලව අයත් වූ සැසඳිය හැකි වත්කම් මූල්‍ය කල්බදු ගිවිසුම් වල පවතින වත්කම් සඳහා වූ ක්ෂය කිරීමේ ක්‍රම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලයන්ට සමානරූපී වේ. අනුරූප මූල්‍ය කල්බදු වගකීම වැය වූ මූල්‍යමය පිරිවැයේ කොටසක් වූ ණය පොලී මුදල් අඩුකළ කල්බදු ගෙවීම් මගින් අඩු වේ. කල්බදු ගෙවීමේ පොලිය නොපිය වූ ප්‍රාග්ධන ශේෂයන්ගෙන් අඛණ්ඩව සමානුපාතිකව ඵලදායී පොලී ක්‍රමය ප්‍රයෝජනයට ගනිමින් ගණනය කර වියදමක් ලෙස කල්බද්ද පවතින කාලය මුළුල්ලේ ලාභාලාභ ගිණුමට ඇතුල් කරයි. අනෙකුත් සියලුම කල්බදු මෙහෙයුම් කල්බදු වශයෙන් සලකනු ලැබේ. මෙහෙයුම් කල්බදු මත ගෙවන ගෙවීම් කල්බදු කොන්දේසි මත සරල මාර්ග ක්‍රමය පාදක කරගත් වියදමක් වශයෙන් හඳුන්වා ඇත. නඩත්තු සහ රක්ෂණය වැනි ආශ්‍රිත පිරිවැය ඒවා හටගන්නා විට වියදමක් ලෙස සලකයි.

4.9 අස්පෘශ්‍ය වත්කම්

වෙන් වෙන් වශයෙන් අත්පත් කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනාගැනීමේදී පිරිවැය අගයට මනිනු ලැබේ. ආරම්භක හඳුනාගැනීමෙන් පසුව අස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත අඩුවීම අඩු කිරීමෙන් පසුව ලැබෙන අගයට පවත්වාගෙන යනු ලැබේ.

ප්‍රාග්ධනිත සංවර්ධන වියදම් බැහැර කරන ලද අභ්‍යන්තරයෙන් ජනනය වූ අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත කරනු නොලබන අතර, එම වියදම දරනු ලබන වර්ෂයට අදාළ ආදායම් ප්‍රකාශය තුළ දක්වනු ලැබේ.

නියමිත ජීවිත කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ඵලදායී ජීවිත කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබන අතර, කිසියම් අවස්ථාවකදී අස්පෘශ්‍ය වත්කම්වල අගය අඩු වන බව පෙන්නුම් කරනු ලැබුවහොත් අඩුවීම වෙනුවෙන් අස්පෘශ්‍ය වත්කම් තක්සේරු කරනු ලබයි. නියත ජීවිත කාලයක් සහිත එම අස්පෘශ්‍ය වත්කම් සඳහා වන ක්‍රමක්ෂය කාල පරිච්ඡේදය සහ ක්‍රමක්ෂය ක්‍රමය අවම වශයෙන් අදාළ මූල්‍ය කාලපරිච්ඡේදය අවසානයේදී ලැබේ. වත්කම් තුළ දක්වනු ලබන අපේක්ෂිත ඵලදායී ජීවිත කාලය හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කරන ආකාරයෙහි ඇති වන වෙනස්වීම් අදාළ පරිදි ක්‍රමක්ෂය කාලපරිච්ඡේදය හෝ ක්‍රමය වෙනස් කිරීම මගින් ගිණුම්ගත කරනු ලබන අතර, එය ගිණුම්කරණ ඇස්තමේන්තුවල ඇති වන වෙනස්වීම් ලෙස සලකනු ලබයි. නියත ජීවිත කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්වලට අදාළ ක්‍රමක්ෂය වියදම් ආදායම් ප්‍රකාශයෙහි අස්පෘශ්‍ය වත්කම්වල කාර්යභාරයට අනුකූල වන පරිදි වියදම් වර්ගය යටතේ හඳුනාගනු ලබයි.

පරිගණක මෘදුකාංග

මිලදී ගනු ලැබූ හෝ වැඩිදියුණු කරන ලද දිනයේ සිට වර්ෂ 4ක් තුළදී පරිගණක මෘදුකාංග ක්‍රමක්ෂය කරනු ලබයි.

4.10 මූල්‍ය උපකරණ - මූලික එකඟතාව හා ඇතිවන ඇගයීම

4.10.1 මූල්‍ය වත්කම්

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සහ මුදල් සහ මුදලට සමාන දෑ

මෙම මූල්‍ය වත්කම් හුවමාරු මිලේදී මූලිකව හඳුනාගැනේ. පසුව මේවා ක්‍රමක්ෂය පිරිවැයේ දී ඵලදායී පොලී ක්‍රමය අනුගමනය කරමින් හානිය සඳහා වෙන්කිරීමක් අඩුකරමින් මනිනු ලබයි. විකුණුම් සාමාන්‍ය ණය කොන්දේසි අනුව කරන අතර, වෙළඳ ණයගැතියන්ගෙන් පොලියක් අය නොකරයි. ලැබිය යුතු වටිනාකම් අයකරගත නොහැකි බවට සාක්ෂි ඇතිවිට හානියේ පාඩුව ලාභාලාභ ගිණුමෙන් හඳුනාගත හැක. වසරකට වැඩි කාලයක් හිඟව පවතින අයවීම් සඳහා සම්පූර්ණයෙන් ප්‍රතිපාදන වෙන්කර ඇත.

දිගුකාලීන මූල්‍ය වත්කම්

දිගුකාලීන මූල්‍ය වත්කම් සාමාන්‍ය කොටස් සුරැකුම්පත් ආයෝජකයන්ගෙන් සමන්විත වේ. ඒවා හුවමාරු මිලේදී මූලිකව හඳුනාගැනේ. මූලික හඳුනාගැනීමෙන් පසුව මහජනයා අතර විකිණෙන හෝ සාධාරණ වෙළඳ වටිනාකම විශ්වාසනීය ලෙස මනිනු ලබන සාමාන්‍ය කොටස්වල ආයෝජනයන් ලාභාලාභයේ දී හඳුනාගත් සාධාරණ වෙළඳ වටිනාකමින් සාධාරණ වෙළඳ වටිනාකමේ වෙනස්වීම් මනිනු ලැබේ. අනෙකුත් සාමාන්‍ය කොටස්වල ආයෝජනයන් ඕනෑම හානියක් අඩුකළ පිරිවැයට මනිනු ලැබේ.

4.10.2 මූල්‍ය වගකීම්

සමූහ ව්‍යාපාරයේ මූල්‍යමය වගකීම් වනුයේ ණය ගැනීම් සහ වෙළඳ සහ අනෙකුත් ගෙවීම් වේ. මූල්‍ය වගකීම් මූලික වශයෙන් ගනුදෙනු කරන මිලේදී හඳුනාගැනේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව මේවා සඵල පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැයේදී මනිනු ලැබේ. වෙළඳ ණය සාමාන්‍ය ණය කොන්දේසි මත ක්‍රියාත්මක වන අතර, පොලියක් ගෙවීමට සිදු නොවේ.

4.11 පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ, කෙටිකාලීන සේවක ප්‍රතිලාභ සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ

4.11.1 පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ

අ) විශ්‍රහ කරන ලද දායකත්ව සැලසුම් (EPF/ETF) සේවා අර්ථසාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

සමූහ ව්‍යාපාරය, සමූහ ව්‍යාපාරය විසින්ම ස්ථිර සහභාගයක් ගෙවන නිදහස් ආයතනයක් යටතේ පවත්නා ස්ථිර සහභාග සැලසුම් (EPF/ETF) මගින් පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සපයයි. සැලසුමට ගෙවන සහභාගය කාලසීමාවට අදාළ වියදමක් ලෙස සලකයි. සහභාගය ගෙවිය යුතුව තිබෙන විට සහ කිසියම් නොගෙවන ලද වටිනාකමක් ජංගම වගකීම් ලෙස සලකයි.

ආ) විශ්‍රහ කරන ලද ප්‍රතිලාභ සැලසුම් (පාරිතෝෂික)

විශ්‍රාමික පාරිතෝෂික වගකීම 1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ පිහිටුවන ලද නිදහස් භාරයක් මගින් පූර්ණ වශයෙන් අරමුදල් ගත කර ඇත. සමාගමේ යෝජනා ක්‍රමයට අනුව සම්පූර්ණයෙන්ම ගෙවිය යුතු අමතර විශ්‍රාමික පාරිතෝෂිකය ස්ථිර සේවය ආරම්භ කළ සියලුම සේවකයින් වෙනුවෙන් සම්පූර්ණයෙන්ම සමාගමේ හිණුම්ගත කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන 28 වන කොටස යටතේ ඉඩ සලසා දුන් සරල කිරීම් ප්‍රයෝජනයට ගනිමින් පාරිතෝෂික වගකීම ගණනය කරයි. සමාගමේ යෝජනා ක්‍රමය යටතේ 2008 ජුනි 05 දිනට පෙර සමාගමට එක්වූ සේවකයින්ගේ විශ්‍රාම පාරිතෝෂික ගෙවීමේ පදනම පහත සඳහන් වේ.

විශ්‍රාම ගැනීමේදී සේවා වෂී ගණන	සේවයේ එකිනෙක වසර සඳහා වේතන සති ගණන
25 ට වැඩි	6
20 සිට 25	4
05 සිට 20	3

සමාගමේ යෝජනා ක්‍රමය යටතේ 2008 ජුනි 05 දා හෝ ඊට පසු සමාගමට එක් වූ සේවකයින්ගේ විශ්‍රාම පාරිතෝෂික ගෙවීමේ පදනම පහත සඳහන් වේ.

විශ්‍රාම ගැනීමේදී සේවා වෂී ගණන	සේවයේ එකිනෙක වසර සඳහා වේතන සති ගණන
20 ට වැඩි	3
05 - 20	2

4.11.2 කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

නිවාඩු හිමිකම් ඇතුළත් කෙටිකාලීන සේවක ප්‍රතිලාභ ගෙවිය හැකි මුදල් යටතේ ඇති ජංගම වගකීම් වේ. සමූහ ව්‍යාපාරය ප්‍රයෝජනයට නොගත් නිවාඩු හිමිකම් සඳහා ගෙවීම් කිරීමට බලාපොරොත්තු වේ.

4.12 ආදායම් හඳුනා ගැනීම

ආදායම ගණනය කරනු ලබන්නේ සමාගම විසින් භාණ්ඩ සැපයීමෙන් හා සේවාවන් ඉටු කිරීමෙන් ලබන ලද හා ලැබිය යුතු දේට විකුණුම් බදු ප්‍රතිදාන සහ වෙළඳ වට්ටම් හැර සාධාරණ වටිනාකමක් ගණනය කිරීමෙනි. පරිපාලන වියදම් තුළ ජාතිය ගොඩනැගීමේ බදු ඇතුළත් වේ.

4.12.1 භාණ්ඩ විකිණීම (බෙදාහැරීම)

සමූහ ව්‍යාපාරය පුවත්පත්, වාර ප්‍රකාශන සහ සඟරා පුවත්පත් නියෝජිතයින්ට, වීදි වෙළඳුන්ට, සංස්ථාපිත ආයතනවලට සහ පුද්ගලයින්ට බෙදාහරිනු ලබයි. භාණ්ඩය මතභේදයකින් තොරව පාරිභෝගිකයා අතට පත්වීම ආදායම වශයෙන් හඳුන්වයි.

4.12.2 සේවාවන් ඉටුකිරීම (දැන්වීම් ප්‍රචාරණය)

සමූහ ව්‍යාපාරය දිනපතා පුවත්පත්, වාර ප්‍රකාශන සහ සඟරා ප්‍රකාශයට පත්කොට සෑම ප්‍රකාශනයක දැන්වීම් ඉඩකඩ අලෙවි කරයි. පෙරගෙවීම් දැන්වීම් හැර නිකුත් කළ දිනට අදාළ ප්‍රකාශනවල දැන්වීම් ආදායම ලෙස සලකණු ලබයි.

4.12.3 කුලී ආදායම

කල්බදු දේපළින් ලැබෙන කුලී ආදායම් උපචිත පදනම මත හඳුනාගැනේ.

4.12.4 පොලී සහ ලාභාංශ ආදායම

පොලී ආදායම උපචිත පදනම මත ඵලදායී පොලී ක්‍රමය අනුගමනය කරමින් හඳුනාගැනේ. ගෙවීම් තහවුරු වී නියමිත කලට මුදල් ලැබුණ විට ලාභාංශ ආදායම ලෙස පිළිගනී.

4.12.5 වෙනත් දෑ

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනු ලබයි. දේපළ යන්ත්‍ර හා උපකරණ විකිණීමෙන් ඇතිවන ආදායම වර්ගයට අදාළ ශුද්ධ ලාභ සහ පාඩු ආදායම් ප්‍රකාශය තුළ ගිණුම් ගත කර ඇත්තේ විකුණුම් ආදායමෙන් පවත්නා අගය සහ අදාළ විකුණුම් වියදම් අඩු කිරීමෙනි.

ප්‍රධාන ආදායම් ඉපැයුම් ක්‍රියාකාරකම්වලට අදාළ අමතර ක්‍රියාකාරකම්වලින් හටගන්නා ලාභ / පාඩු සහ වැදගත් නොවන ඒ හා සමාන ගනුදෙනු සමූහයකින් හටගන්නා ලාභ / පාඩු සමුච්චය වීම, වාර්තාවීම හා ඉදිරිපත් කිරීම ශුද්ධ පදනම මත සිදු වේ.

4.13 සැලකිය යුතු ගිණුම්කරණ උපකල්පන, තීරණ සහ ඇස්තමේන්තු

සමූහ ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදවීමේ ක්‍රියාවලිය තුළ කළමනාකාරිත්වය විසින් ඇස්තමේන්තු කිරීම්වලට අමතරව තීරණ ගැනීම් සිදු කළ යුතුව ඇති අතර, එමගින් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන ඇති ප්‍රධාන වටිනාකම සඳහා මූලික බලපෑමක් ඇති කරනු ලබයි. තවද කළමනාකාරිත්වය විසින් ශේෂ පත්‍ර දිනට අවිනිශ්චිතතාව පිළිබඳ අනාගත සහ වෙනත් මූලාශ්‍ර මගින් තක්සේරු කරනු ලබන මූලික උපකල්පනයන් සිදු කළ යුතුව ඇති අතර, ඉදිරි වර්ෂය තුළදී වත්කම් සහ වගකීම්වල පවත්නා අගයට වැදගත් ගැළපීම් සිදු කිරීමට ද අවදානමක් ඇති එම මූලික උපකල්පනයන් පහතින් සාකච්ඡා කොට ඇත.

කල් බදු

කල් බදුවලට අදාළ කිසියම් පිළිවෙළක් තුළ කල් බදු ක්‍රමයක් අන්තර්ගත ද යන්න නිශ්චය කරනු ලබන්නේ අදාළ කල් බදු පිළිවෙළෙහි ආරම්භක දිනට පවතින හරය මූලික කොට ගෙන අදාළ පිළිවෙළ සම්පූර්ණ වීම වත්කම් හෝ කිසියම් වත්කම් උපයෝගී කොට ගෙන සිදුවීම හෝ අදාළ පිළිවෙළ අදාළ වත්කම පරිහරණය කිරීමට පැහැදිලි ලෙස අයිතියක් නියම වශයෙන් සඳහන් නොවුවද එම වත්කම පරිහරණය කිරීමට අයිතියක් පවරා දීම යනාදිය අදාළ කොට ගෙනය. ආයතන සමූහය විසින් තනි තනිව හෝ ඒකාබද්ධ වශයෙන් තීරණය කරන ලද උපමානයන් අදාළ කල් බද්ද මූල්‍ය හෝ මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කිරීමට හේතු වේ.

මූල්‍ය උපකරණවල සාධාරණ අගය

සක්‍රීය වෙළඳපල මගින් සාධාරණ අගය ලබාගත නොහැකි මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල සාධාරණ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ වාර්තා කිරීමේදී වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය ඇතුළත් විවිධ තක්සේරු ක්‍රම උපයෝගී කර ගනු ලැබේ. මෙම නිරූපක සඳහා යෙදවුම් ලබා ගන්නේ හැකි පමණින් නිරීක්ෂය වෙළඳපල තුළින් වන අතර, එසේ ලබාගත නොහැකි අවස්ථා වලදී සාධාරණ අගය තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් විනිශ්චයක් අවශ්‍ය වේ. මෙම විනිශ්චය තුළ ද්‍රවශීලිතාවය පිළිබඳ අවදානම, ණය අවදානම සහ උච්චාවචනයන් යනාදී යෙදවුම් විචාරණයන් ඇතුළත්වේ. මෙම කරුණුවලට අදාළ උපකල්පනයන්හි වෙනස්වීම් මූල්‍ය උපකරණවල වාර්තා කරන ලද සාධාරණ අගයෙහි වෙනස් වීමට හේතු වේ.

මූල්‍ය නොවන වත්කම්වලට අදාළ අගය අඩුවිට සමාලෝචනය

සමූහය විසින් මූල්‍ය නොවන වත්කම්වලට අදාළව අගය අඩු වී ඇත්දැයි අගය අඩුවීම පිළිබඳ සමාලෝචනයක් මගින් සිදු කරයි.

මේ සඳහා මුදල් උපයන අංශයන්වලට අදාළ ව්‍යවහාර වටිනාකම පිළිබඳ ඇස්තමේන්තුවක් අවශ්‍ය වේ. මෙම ව්‍යවහාර වටිනාකම ඇස්තමේන්තු කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් මුදල් උපයන අංශවලට අදාළ අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් පිළිබඳ ඇස්තමේන්තු කිරීමක් සිදු කළ යුතු වන අතර, අදාළ මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම ගණනය කිරීම සඳහා යෝග්‍ය වට්ටම් අනුපාතිකයක් තෝරා ගත යුතු වේ. මෙම තක්සේරු කිරීම මගින් සමූහය විසින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් අනුපාතික යනාදිය පිළිබඳ ඇස්තමේන්තු කිරීම් යනාදිය සිදු කළ යුතු අතර, එම කරුණු අවිනිශ්චිත බවෙන් යුතු වේ.

වෙළඳ සහ වෙනත් ලැබිය යුතු අයවීම්වලට අදාළ අගය අඩුකිරීමේ පාඩු

වෙන් වෙන් වශයෙන් තක්සේරු කිරීමෙන් පසුව ක්‍රමක්ෂය නොකරන හඳුනාගත් වෙළඳ සහ වෙනත් ලැබිය යුතු අයවීම් සහ වෙන් වෙන් වශයෙන් ගත් කල නොවැදගත් ලැබිය යුතු සමාන ගති ලක්ෂණ ඇති වත්කම් කණ්ඩායම් ලෙස සාමූහික වශයෙන් තක්සේරු කරනු ලබන අතර, එසේ තක්සේරු කරනු ලබන්නේ විෂය බද්ධ සාධක සහිත පාඩු ලබන ලද සිදුවීම් සඳහා අදාළ සිදුවීම් තුළින් සිදු වන ප්‍රතිවිපාක දක්වන සාධක මෙතෙක් නොමැති වුවද එම සිදුවීම් සඳහා ප්‍රතිපාදන වෙන් කළ යුතු ද යන කරුණ තීරණය කිරීමටය. සාමූහික තක්සේරුව මගින් ලැබිය යුතු අයවීම් ගොනුව තුලින් ගනු ලබන දත්ත සැලකිල්ලට ගනු ලබන අතර, (හිඟයන්හි මට්ටම, ණය ප්‍රයෝජනයට ගන්නා ආකාරය යනාදිය) ආර්ථිකමය දත්ත සහ අවදානම් ඒකාරාශී වීම මගින් ඇති වන ප්‍රතිඵල පිළිබඳ විනිශ්චය (සේවා වියුක්ති මට්ටම, ඉඩකඩම් මිල දර්ශන, ආර්ථික අවදානම, විවිධ පුද්ගලික කණ්ඩායම්වල ක්‍රියාකාරිත්වය) යනාදී කරුණු ද අදාළ කරගනු ලැබේ.

බදු

අගය එකතු කළ බද්ද ද ඇතුළුව අනෙකුත් බදු සහ ආදායම් බදු සඳහා සමූහය යටත් වේ. මූල්‍ය ගිණුම් ප්‍රකාශන තුළ සුළු හා මධ්‍ය පරිමාණ ආයතනවලට අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීමේදී බදු නිර්දේශයන්ට අනුකූලව ජංගම, විලම්භිත සහ වෙනත් බදු සඳහා වන මුළු ප්‍රතිපාදනය තීරණය කිරීම සහ බදු අයකළ හැකි ලාභය තීරණය කිරීම සඳහා සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය විය. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේදී නියමයන් යොදා ගන්නා ආකාරය අර්ථ දැක්වීම පිළිබඳ අවිනිශ්චිතතා පවතින ලදී.

ජංගම, විලම්භිත සහ වෙනත් බදු සඳහා අමතර බදු හිඟව පවතීද යන කරුණ ඇස්තමේන්තු කිරීමේදී සමූහය විසින් වත්කම් සහ වගකීම් සැලකිල්ලට ගන්නා ලදී. ආරම්භයේදී අප විසින් වාර්තා කරන ලද වටිනාකම්වලට වඩා මෙම කරුණුවලට අදාළ අවසාන බදු ප්‍රතිඵලය වෙනස් වීමේදී එම වෙනස්කම් ආදායම්, විලම්භිත සහ බදු වටිනාකම් සඳහා නිර්ණය වූ කාලපරිච්ඡේදයට අදාළව බලපෑමක් ඇති කරනු ඇත.

ප්‍රයෝජනයට නොගන්නා ලද බදු පාඩු උපයෝජනය කිරීම සඳහා ප්‍රමාණවත් තරම් බදු ගෙවිය යුතු ලාභ පවතින බවට සසම්භාවී වූ විටදී ඒ සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලැබේ. එම විලම්භිත බදු වත්කම් වටිනාකම තීරණය කිරීම සඳහා සැලකිය යුතු ලෙස කළමනාකරණ විනිශ්චයක් අවශ්‍ය වන අතර, ඒ සඳහා සුදුසු කාල නිශ්චය අනාගත බදු ගෙවිය යුතු ලාභ සහ අනාගත බදු සැලසුම් උපාය මාර්ග යනාදිය පදනම් කර ගනී.

දේපළ, පිරියත හා උපකරණවල ඵලදායී ජීව කාලය

සෑම වාර්තා කරනු ලබන දිනයකදීම සමූහය විසින් වත්කම්වල අවශේෂ වටිනාකම, ඵලදායී ජීව කාලය සහ ක්ෂය කරනු ලබන ක්‍රමය විමර්ශනය කරනු ලබයි. මෙම වටිනාකම්, අනුපාත සහ විධික්‍රම තක්සේරු කිරීමේදී කළමනාකාරිත්වයේ විනිශ්චය යොදාගනු ලැබේ.

4.14 අදාළ පාර්ශ්වයන්ගේ ගනුදෙනු

සමූහ ව්‍යාපාරයේ අදාළ පාර්ශ්වයන් යනු එහි පරිපාලිතයන් සහ ප්‍රධාන කළමනාකාරිත්වයයි. මෙම පාර්ශ්වයන්ට සංස්ථාපිත විශේෂ කොන්දේසි සහ ඇප සහතික ලැබීමට හෝ ගෙවීමට නැත. නොපිය වූ ශේෂයන් සුරක්ෂිත නොවන අතර, ඒවා සාමාන්‍යයෙන් මුදලින් බේරුම් කරනු ලැබේ.

4.14.1 ප්‍රධාන කළමනාකාරිත්වය සමග ඇති ගනුදෙනු

ආයතනයේ මෙහෙයවීම සහ පාලනය කිරීමේ අධිකාරිමය බලය සහ වගකීම ඇති ආයතනයේ ප්‍රධාන කළමනාකාරිත්වය අදාළ පාර්ශවය යටතට අයත් වේ. ආයතනයේ ප්‍රධාන කළමනාකාරිත්වය යනු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ය.

අධ්‍යක්ෂකවරයාගේ නම	තනතුර
අනුෂ පැල්පිට මහතා	සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ
මහාචාර්ය හරේන්ද්‍ර කාරියවසම් මහතා	අධ්‍යක්ෂ
මංජුල මාකුඹුර මහතා	අධ්‍යක්ෂ
ජනක රණතුංග මහතා	අධ්‍යක්ෂ
සිසිර පරණතන්ත්‍රි මහතා	අධ්‍යක්ෂ

අධ්‍යක්ෂක මණ්ඩල වේතනය රු. මිලියන 36 ක් වන අතර, එය මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් අංක 26 හි දක්වා ඇත.

4.14.2 පරිපාලිත සමාගම් සමග ගනුදෙනු

ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පෞද්ගලික) සමාගම

පරිපාලිතය විසින් 2014 වසරේ රු. මි. 3.8 ක් වටිනා ඉඩම් හා ඉඩම් සංවර්ධන පිරිවැය මව් සමාගම වෙත මාරු කරන ලදී. මව් සමාගම විසින් වර්ෂය තුළදී වියදම් දරා නොමැත. මෙම ගනුදෙනුවත් සමග 2022 දෙසැම්බර් 31 දිනට පරිපාලිතය වෙත ගෙවිය යුතු මුළු මුදල රු. මි. 18.7 ක් ලෙස පැවතිනි.

4.15 අසම්භාව්‍ය බැරකම්

සමාගමට විරුද්ධව නඩු 40 ක් විනිශ්චය සඳහා තවමත් නොවිසඳී පවතී. මෙම වෙන්කිරීම පිළිබඳව විස්තර මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 20 යටතේ අනාවරණය කර ඇත. 2020 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල සමාගමට විරුද්ධ නඩු සඳහා ප්‍රතිපාදනයක් ලෙස එම ඉල්ලීම්වල මුළු වටිනාකමෙන් 0.4% ක් ඇස්තමේන්තු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

5.1 සැසඳුම්

සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අදාළ වන දෑ හැරුණු විට ආයතනය මගින් ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂය හා සැසඳෙන අතර ඒකාකාරී ලෙස ආයතනය මගින් ක්‍රියාත්මක කොට ඇත. සලකා බලන වර්ෂයට අදාළ වන පරිදි පෙර වර්ෂයේ සංඛ්‍යා සහ වාක්‍ය කණ්ඩයන් අවශ්‍ය ලෙස නැවත සකස් කොට දක්වා ඇත.

5.2 වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව ඇති වූ සිදුවීම්

වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව ඇති වූ සියලුම වැදගත් සිදුවීම් ගිණුම් වාර්තාවලට අදාළ සටහන්වල අවශ්‍ය පරිදි සැලකිල්ලට ගෙන අනාවරණය කර ඇත.

සටහන් - 06

6.1 දේපළ යන්ත්‍ර හා උපකරණ (සමාගම)

පිරිවැය

අයිතම	ශේෂය 2022/01/01 රු.'000	ප්‍රත්‍යාගණය 2022 රු.'000	එකතු කිරීම් 2022 රු.'000	ඉවත් කිරීම් 2022 රු.'000	මාරුකිරීම්/ ගැලපීම් 2022 රු. 000	ශේෂය 2022/12/31 රු.'000
නිදහස් දේපළ	1,287,860	-	-	-	-	1,287,860
ගොඩනැගිලි	113,351	-	-	-	-	113,351
පරිගණක හා සවිකිරීම්	196,153	-	17,016	-	-	213,169
යන්ත්‍ර හා උපකරණ	1,395,669	-	2,370	-	-	1,398,039
මෝටර් රථ හා ගරාජ් උපකරණ	64,697	104,250	529	-	-	169,476
කල්බදු මෝටර් වාහන	18,900	16,725	-	-	-	35,625
ලී බඩු හා උපකරණ	49,171	-	356	-	(65)	49,462
එකතුව	**3,125,801**	**120,974**	**20,271**	**-**	**(65)**	**3,266,982**

ක්ෂය කිරීම්

අයිතම	ශේෂය 2022/01/01 රු.'000	ප්‍රත්‍යාගණය 2022 රු.'000	එකතු කිරීම් 2022 රු.'000	ඉවත් කිරීම් 2022 රු.'000	මාරුකිරීම්/ ගැලපීම් 2022 රු. '000	ශේෂය 2022/12/31 රු.'000
නිදහස් දේපළ	-	-	-	-	-	-
ගොඩනැගිලි	76,896	-	2,708	-	-	79,604
පරිගණක හා සවිකිරීම්	187,866	-	6,259	-	-	194,125
යන්ත්‍ර හා උපකරණ	1,298,353	-	35,174	-	-	1,333,527
මෝටර් රථ හා ගරාජ් උපකරණ	62,563	4,754	-	-	-	67,317
කල්බදු මෝටර් වාහන	3,938	1,156	3,938	-	-	9,031
ලී බඩු හා උපකරණ	39,747	-	2,546	-	(31)	42,263
එකතුව	**1,669,363**	**5,910**	**50,625**	**-**	**(31)**	**1,725,867**

ඉදිරියට ගෙනා ශේෂය

අයිතම	2022/12/31 දිනට රු.'000	2021/12/31 දිනට රු.'000
නිදහස් දේපළ	1,287,860	1,287,860
ගොඩනැගිලි	33,747	36,455
පරිගණක හා සවිකිරීම්	19,044	8,287
යන්ත්‍ර හා උපකරණ	64,512	97,316
මෝටර් රථ හා ගරාජ් උපකරණ	102,159	2,134
ලී බඩු හා උපකරණ	26,594	9,423
කල්බදු මෝටර් වාහන	7,199	14,963
නොනිමි ප්‍රාග්ධනය	-	4,924
එකතුව	**1,541,115**	**1,461,362**

සටහන් - 06

6.2 දේපළ යන්ත්‍ර හා උපකරණ (සමූහය)

පිරිවැය

අයිතම	ශේෂය 2022/01/01 රු.'000	ප්‍රත්‍යාගණය 2022 රු.'000	එකතු කිරීම් 2022 රු.'000	ඉවත් කිරීම් 2022 රු.'000	මාරුකිරීම්/ ගැලපීම් 2022 රු.'000	ශේෂය 2022/12/31 රු.'000
නිදහස් දේපළ	1,287,859	-	-	-	-	1,287,859
ගොඩනැගිලි	113,350	-	-	-	-	113,350
පරිගණක හා සවිකිරීම්	196,154	-	17,016	-	-	213,170
යන්ත්‍ර හා උපකරණ	1,395,669	-	2,370	-	-	1,398,039
මෝටර් රථ හා ගරාජ් උපකරණ	64,697	104,250	529	-	-	169,476
කල්බදු මෝටර් වාහන	18,900	16,725	-	-	-	35,625
ලී බඩු හා උපකරණ	49,171	-	356	-	(65)	49,462
එකතුව	**3,125,801**	**120,974**	**20,270**	**-**	**(65)**	**3,266,982**

ක්ෂය කිරීම්

අයිතම	ශේෂය 2022/01/01 රු.'000	ප්‍රත්‍යාගණය 2022 රු.'000	එකතු කිරීම් 2022 රු.'000	ඉවත් කිරීම් 2022 රු.'000	මාරුකිරීම්/ ගැලපීම් 2022 රු. '000	ශේෂය 2022/12/31 රු.'000
නිදහස් දේපළ	-	-	-	-	-	-
ගොඩනැගිලි	76,896	-	2,708	-	-	79,604
පරිගණක හා සවිකිරීම්	187,866	-	6,259	-	-	194,125
යන්ත්‍ර හා උපකරණ	1,298,353	-	35,174	-	-	1,333,527
මෝටර් රථ හා ගරාජ් උපකරණ	62,563	4,754	-	-	-	67,317
කල්බදු මෝටර් වාහන	3,938	1,156	3,938	-	-	9,031
ලී බඩු හා උපකරණ	39,747	-	2,546	-	(31)	42,263
එකතුව	**1,669,363**	**5,910**	**50,625**	**-**	**(31)**	**1,725,866**

ඉදිරියට ගෙනා ශේෂය

අයිතම	2022/12/31 දිනට රු.'000	2021/12/31 දිනට රු.'000
නිදහස් දේපළ	1,287,859	1,287,860
ගොඩනැගිලි	33,746	36,455
පරිගණක හා සවිකිරීම්	19,045	8,287
යන්ත්‍ර හා උපකරණ	64,512	97,316
මෝටර් රථ හා ගරාජ් උපකරණ	102,159	2,134
ලී බඩු හා උපකරණ	7,199	9,423
කල්බදු මෝටර් වාහන	26,594	14,963
නොනිමි ප්‍රාග්ධනය	-	4,924
එකතුව	**1,541,115**	**1,461,362**

සටහන් - 06

6.3 ලේක්හවුස් ආයතනයට අයත් සින්නක්කර ඉඩම්

1. හෝකන්දර ඉඩම
2. කොටහේන ගබඩාවට අයත් ඉඩම

6.4 ලේක්හවුස් ආයතනයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම 99 අවුරුදු බදු පදනමට හිමිසුම් ගෙන ඇති අතර, එයට අදාළව මෙහෙයුම් බදුකරය 2024 දෙසැම්බර් 18 දිනෙන් අවසන් වේ. වසර 30 ක කාලයක් සඳහා කල්බදු කාලය දීර්ඝ කිරීම ලබාදී ඇති දින සිට වත්මන් කල්බදු කාලය අවසන් වේ. කැබිනට් පත්‍රිකාව අංක 22/2165/609/0-29

6.5 කතරගම පිහිටි ඉඩම 99 අවුරුදු බදු පදනමට හිමිසුම්ගෙන ඇති අතර, එයට අදාළව මෙහෙයුම් බදුකරය 2087 ජූලි 13 දිනෙන් අවසන් වේ.

6.6 කතරගම පිහිටි ගොඩනැගිල්ල 2015 වර්ෂයේදී ඉදිකොට ඇති අතර, එය "ආයෝජන වත්කම්" ලෙස නැවත වර්ග කොට පිරිවැය අගයට දක්වා ඇත.

6.7 සමාලෝචිත වර්ෂය තුළ ආයතන සමූහය මුළු වටිනාකම රුපියල් මිලියන 20ක් (2021 වර්ෂයේදී රුපියල් මිලියන 35ක්) වූ මුදලක් දේපළ යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම සඳහා යොදවන ලදී.

6.8 දේපළ, යන්ත්‍ර හා උපකරණ තුළ මුදල් ප්‍රවාහයක් ඇති කරන පිරිවැය රුපියල් මිලියන 1,538 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ඇතුළත් වන අතර, ආයතනය මගින් එම වත්කම්වල ජීව කාලය නැවත තක්සේරු කරනු ලැබේ.

6.9 ප්‍රත්‍යාගණනය

ඉඩම් ප්‍රත්‍යාගණනය

6.9.1 හිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

සමාගම ඉඩම් මැනීම සඳහා ප්‍රත්‍යාගණනය ක්‍රමය භාවිත කර ඇත. සමාගම සතු ඉඩම් වල සාධාරණ අගය මැනීම සඳහා ස්වාධීන තක්සේරුකරුවෙකු යොදා ගන්නා ලදී. සාධාරණ වටිනාකම තීරණය කරනු ලබන්නේ, සමාන දේපළ සඳහා වෙළඳපොළ සාක්ෂි මත පදනම් වූ ගනුදෙනු මිල ඇසුරෙනි. තක්සේරු කිරීම විවෘත වෙළඳපොල මිල ගණන් මත පදනම් වූවත්, නිශ්චිත දේපලෙහි ස්වභාවය, ස්ථානය හෝ කොන්දේසි අනුව වන වෙනස්කම් ද ගැළපීමට ලක්කර ඇත.

මෙම තෙක්සේරු ක්‍රම සාධාරණ අගය ගණනය කිරීම සඳහා සුදුසු තත්ත්වයන් සහ ප්‍රමාණවත් දත්ත, අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදවුම් භාවිතය උපරිම කිරීම සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් අවම කිරීම තුළින් අදාළ කර ඇත. නවතම ප්‍රත්‍යාගණනය 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාලය තුළ සිදු කරන ලදී.

සාධාරණ වටිනාකමේ වෙනස්වීම්, අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සහ හිමිකම වෙනස් වීමේ ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත. තක්සේරුකරු විසින් දේපලෙහි ස්වභාවය මත පදනම්ව ලබා ගත හැකි සංසන්දනාත්මක වෙළඳපොළ දත්ත හිඟ වූ විට වෙළඳපොල වටිනාකම් සහ වට්ටම් සහිත මුදල් ප්‍රවාහ ක්‍රම වැනි තක්සේරු ක්‍රම භාවිතා කර ඇත.

2021 දෙසැම්බර් 31 වනදා වන විට තක්සේරු කිරීම ඉහළ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයක් අඩංගු වූයේ, සාමාන්‍යයෙන් සාධාරණ වටිනාකමක් සම්බන්ධයෙන් සාක්ෂි ප්‍රභවයක් වන වෙළඳපල ගනුදෙනු අඩු බැවින් අගය කරන්නන්ගේ පවතින වෙළඳපොළ තත්ත්වයන් මත පදනම් වූ හොඳම ඇස්තමේන්තුව පිළිබිඹු කරන අගයයි. සලකා බැලූ මතය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා SLFRS ඇතුළුව SLFRS-13 සාධාරන වටිනාකම් මිනුම්වල අවශ්‍යතා සපුරාලයි.

6.9.2

ඉඩම්	වරලත් තක්සේරුකරුගේ නම	පර්චසයක ඇස්තමේන්තුගත මිල	තක්සේරු කිරීමේ ක්‍රම
හෝකන්දර	ඒ.ඒ.එම්. ෆාතිහූ	රු. 500,000 රු. 1,250,000	ජාතික සංවර්ධන සැලැස්මේ උපකල්පන මත පදනම්ව සකස් කරන ලද විවෘත වෙළඳපොල වටිනාකම
කොටහේන	- එම -	රු. 4,750,000 රු. 6,000,000	විවෘත වෙළඳපොල වටිනාකම

